භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2025 නොවැම්බර් - දෙසැම්බර් | 126 වන කාණ්ඩය - 06 කලාපය | පිටු 32 | DOP/NEWS/02/2025

## ජීවිතය සුරකින සාමය ද?



## ජීවිත නසන යුද්ධය ද?

ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# ජේසුනේ සාමයෙ කුමරුවනේ

ගී පද - චන්ද්‍රදාස ප්‍රනාන්දු
තනු නිර්මාණය - සුනිල් පෙරේරා, පියල් පෙරේරා
ගායනය - ජිප්සීස් සංගීත කණ්ඩායම



උරුමය වෙනුවෙන් මේ පොළොවේ අපි සටන් කළා මදි ද?
ජීවිත වැනසුණා මිසක් අපි ලැබූ ජයක් ඇති ද?
එදා මෙදා තුළ රටට අහිමි වුණ ජීවිත කොපමණ ද?
මැරුණෙත් මැරුවෙත් විපතට වැටුණෙත් මේ අපි අපිම නොවෙද?
මැරුණෙත් මැරුවෙත් විපතට වැටුණෙත් ශ්‍රී ලාංකිකයො නොවෙද?

තව කොපමණ බිරිඳන් මේ රටේ වැන්දඹුවන් විය යුතු ද?
තව කොපමණ අම්මාවරු අනේ අසරණ විය යුතු ද?
තව කොපමණ දූ දරුවන් රටේ අනාථ විය යුතු ද?
යුද්ධය වෙනුවෙන් තව කොපමණ ජීවිත අපි බිලි දිය යුතු ද //

ජේසුනේ සාමයේ කුමරුවනේ
අපේ පව් කමා කරලා
අපට සාමෙ ලබා දෙන්න
ජේසුනේ සාමයේ කුමරුවනේ
යුධ ගිනි නිවා දමලා
අපට සාමෙ ලබා දෙන්න
වෛරය වෙනුවට ප්‍රේම කරන්නට අපට කියා දෙන්න
සාමයෙ හිරු රැස් පතිත වෙන්න තව කොපමණ කල් යයි ද //

පනස් හයේ අපි වියරු වෙලා කළ වැරදි මතක නැද්ද?
උණු තාර බැරල්වල දාලා කිරි දරුවො මැරුවෙ නැද්ද?
අසූ තුනේදිත් පවුල් පිටින් අමු අමුවෙ මැරුවෙ නැද්ද?
අනේ දෙවියනේ මෙතෙක් කලක් අපි ගෙවන්නෙ ඒ පව් ද?
අනේ දෙවියනේ පව් කළ අප හට සමාව දෙනවා ද?

අරන්තලාවේ භික්ෂු ඝාතනය හිතට එන්නෙ නැද්ද?
ලේ පිපාසයෙන් කපල කොටල හිමිවරුන් මැරුවෙ නැද්ද?
අනුරපුරේ ශ්‍රී මහ බෝධිය ලේ විලක් කළේ නැද්ද?
අනේ දෙවියනේ මෙතෙක් කලක් අපි ගෙවන්නෙ ඒ පව් ද?
අනේ දෙවියනේ පව් කළ අප හට සමාව දෙනවා ද?

ජේසුනේ සාමයෙ කුමරුවනේ... //

පුරා දශක තුනකට ආසන්න කාලයක්, මේ පුංචි දූපතේ වැසියන් කුරිරු යුද්ධයකින් අපමණ පීඩා විඳි බව කෙසේ නම් අමතක කරන්න ද? ඒ සමය තුළ දේශාභිමානී ගී, රණකාමී ගී මෙන්ම ජාතිවාදී නැම්මක් ගත් ගීත පවා බිහි වූවත්, මානව දයාවට සහ සාමයට අනුබල දුන් ගීත අතලොස්සක්ද රසිකයන් දෝතින් වැළඳ ගත් බව නොරහසකි. ඒ අතර, "ජේසුනේ සාමයේ කුමරුනේ" ගීතය සුවිශේෂත්වයක් උසුලන්නේ එය සාමය පිළිබඳ කිතුනු ඇසකින් ලියන ලද්දක් නිසාම ය.

ජිප්සීස් වාදක මඬුල්ල ගායනා කළ සෑම ගීතයක්ම පාහේ ජනයා අතර ජනප්‍රිය වීමට එක් ප්‍රධාන සාධකයක් වුයේ ඒවා ලියැවුණු සරල රචනා ශෛලිය යි. මෙම ගී පද ද එයට කදිම උදාහරණයකි. රචකයා අප හමුවේ ඉදිරිපත් කරන බැලූ බැල්මට අසංකීර්ණ, එහෙත් සැබවින්ම බරපතල මේ ප්‍රශ්නාවලිය වනාහී ශ්‍රී ලාංකිකයන්ගේ හදවත සිදුරු කරනා 'හී සැර සමුදායක්' යැයි කීම අතිශයෝක්තියක් නොවේ. අප සටන් කළා මදි ද?, අප ලැබූ ජයක් ඇති ද?, අහිමි වුණ ජීවිත කොපමණ ද? මැරුණෙත් මැරුවෙත් විපතට වැටුණෙත් මේ අපි අපි ම නොවෙද?

දෙවැනි අන්තරා කොටස තුළ රචකයා අපගේ අවධානය හරවන්නේ යුද්ධය හේතුවෙන් වැඩිම බලපෑම එල්ල වන ජන කොට්ඨාසයන් වෙත ය. වැන්දඹුවන්, මව්වරුන්, සහ ළමුන් පිළිබඳ ගැඹුරු කතිකාවතකට යොමුවන්නට රචකයා අපව යොමු කරවයි. තෙවැනි අන්තරා කොටස අමිහිරි අතීතයකට අපව රැගෙන යයි. නිදහස ලැබීමෙන් පසුව මුල සිටන්ම අප එකිනෙකා මරා දැමීමට තරම් අප කුරිරු වූ හැටි ගීතය අමු අමුවේ හෙළි කරයි. අප විසින්ම පිළිතුරු සපයා ගත යුතු ඒ පැනයන් සියල්ල අවසානයේ, රචකයා සාමයේ කුමරුවාණන් හට යැදුමකින් ආමන්ත්‍රණය කරයි. ඔහු වක්‍රාකාරව පවසන්නේ, ඉහත ප්‍රශ්න වලට සැබෑ පිළිතුරු ඇත්තේ උන්වහන්සේ තුළ පමණක් බව ද?

ජේසුනේ, යුධකාමී මානසිකත්වය නමැති පාපයට, සතුරාගෙන් පළිගැනීමේ පාපයට, වෛරයේ ගිනි ඇවිලීමේ පාපයට අපට කමාව දුන මැනව. වෛරය වෙනුවට ප්‍රේම කරන්නට අපට කියා දුන මැනව. යුධ පිටියේ යුද්ධය දැන් අවසන් වී ඇත. නමුත් වෛරය වෙනුවට ප්‍රේම කිරීමේ සැබෑ අරගලය අප ජීවිත කාලය පුරාවටම කළ යුත්තක් නොවේද? සාමයේ කුමරාණන් උපත ලැබීම සිහිකරනා සෑම නත්තලකම අප අපෙන්ම අසා ගත යුතු මුඛ්‍ය පැනය වන්නේ එය යි.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

2025 නොවැම්බර් - දෙසැම්බර්


ප්‍රකාශනය

නිර්මල මරිය නිකාය

භාරකරු

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහාය

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
මිල්ශානි ප්‍රනාන්දුපුල්ලේ

කවරය නිර්මාණය

අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම

නිලුමිණ හර්ෂාන්

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 ගිනි අතරින් ... - කීර්ති සඳරුවන් ප්‍රනාන්දු

6 නොමැති තැන සාමය ... - බුද්ධික සඳරුවන්

8 ජීවිත සුරකින ... - ගරු රොෂෙල් ගුරුසිංහ පියතුමා

9 යුද්ධය පරදා සාමය සුරකිමු - අයිරින් කොස්තා

10 නො ඇවිලිය යුතු ගිනි - පූර්ණි නතාෂා

11 මිහිතලයම දෙව් විමනක් වී - මල්මි සිල්වා

12 ජන සන්නිවේදනයේ ... - රූපස් ප්‍රැන්සිස්

13 ගරු හර්මන් පෝල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
ගරු ශානිල් ජයවර්ධන නි.ම.නි. පියතුමා

14 Heal the World
ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

15 ශ්‍රී කුරුසියේ මහිමයෙන් ... - හේමාල් පෙරේරා

16 කෙටි කතාව - රෝහිණි කුමාරි මුවන්දෙනිය

17 සවන් දෙන්න - ඩෙන්සිල්

18 හෙළිදරව්වක ප්‍රගතිය ... - මංගල ජයවර්ධන

20 මුනිවර ජෙරොම් තුමා - මලින්ත බෝපෙආරච්චි

21 වස්සානයට ආයුබෝවන් - රවිඳු ප්‍රශාන්ත

22 ආධ්‍යාත්මය සහ ආගම් - සපුගස්කන්දේ රංජිත්

23 හඳමු ලස්සන ලෝකයක් - ඩික්සන් ක්‍රිස්ටෝපර්

24 කාව සිත - චමත් බී. පයාගල
දේව මෑණියෝ - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු

25 ඕං එහෙනං - සූරිය මාමා

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 88
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 86 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව යි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළ වන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

මිනිසුන් රට රටවල් ලෙස බෙදී යුද වදිති. කණ්ඩායම් ලෙස බෙදී යුද වදිති. ආගම් ලෙස බෙදී යුද වදිති. කුල මල භේද නිසා යුද වදිති. එසේම බොහොමයක් දෙනා මේ යුද වදින්නන් දෙස බලා තමා සාමකාමී යැයි සිතා දාර්ශනික වදන් දෙසති, කවි ගී රචනා කරති, හරවත් ඔවදන් පවසති. නමුත් තම සිත තුළම බෙදුම්වාදී අදහස් මුල්කොටගෙන හටගන්නා යුද්ධය දකින්නේ කවදා ද? මහා යුද්ධවලට පවා අත වනන ඒ සිතිවිලි දකින්නේ කවදා ද? ඇතුළාන්ත සාමය බිඳෙන හැම මොහොතේ ම එතැන ඇත්තේ ඇතුළාන්ත යුද්ධයක් නොවේ ද? ඇතැම් විට අප අසල්වැසියාවම සිතින් කෙළෙසා තලා පෙළෙන අවස්ථා නැති ද? අප අපෙන් ම විමසා සිටිමු. සාමය අප තුළින් ම අරඹමු. ඇතුළාන්ත සාමය වනසා, මරණයට මං නොතනා, නිමල සිත්සන්තානයක් තුළින් ජීවනය පිරි නව උපතක් අත්දකිමු.

අචල රූපසිංහ

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල : bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)


Rs. 1700.00 for two years (Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

හෙළිදරව්ව

# ජීවිත සුරකින සාමය ද? ජීවිත නසන යුද්ධය ද?



තමන්ගේ බලය, ආධිපත්‍යය තහවුරු කර ගන්නට ඈත අතීතයේ සිට ම මිනිස්සු ගැටුම් ඇති කර ගත්තෝ ය. ගැටුම කෝලාහලයක් දක්වා වර්ධනය වී ඉන් යුද්ධයක් ද හට ගත හැකි ය. ඒ අනුව දෙපාර්ශවයක් අතර ඇති වන ගැටුම නිසා එකිනෙකාව විනාශ කර ගන්නා ක්‍රියාදාමයකට පිවිසීම යුද්ධයක් ලෙස හඳුනා ගත හැකි ය. මනුෂ්‍යත්වය විනාශ කරන අන්ධකාරයකි, යුද්ධය. යුද්ධයක් නිර්මාණ වන්නට ඇතිවන පොදු සාධකය වන්නේ බලයට හෝ වස්තුවට හෝ ආධිපත්‍යයට ඇති කෑදරකම යි. තණ්හාව යි. අනෙකාව යටපත් කර ගෙන තමන් ඉදිරියට ඒමට දරන නරක ආත්මාර්ථකාමී උත්සාහයක ප්‍රතිඵලයකි, යුද්ධය. විවිධ කාරණා හරහා යුද්ධ ඇති වේ.

- ජාතීන් අතර මත භේද
- ආගම් අතර අන්තවාදී අදහස්
- රටවල් අතර බල තණ්හාව
- දේශ සීමාවන් අල්ලා ගන්නට දරන වෑයම්
- ත්‍රස්තවාදී සංවිධාන නිසා ඇති වන ගැටුම්
- ඇති නැති පරතරය නිසා හටගන්නා කැළඹීලි

මෙවැනි හේතූන් නිසා ඉතිහාසය පුරා මෙන් ම වර්තමානයෙත් යුද වාතාවරණයන් දැක ගත හැකි ය.

යුද්ධයක් ඇති කරන විනාශය ඉක්මනින් අවසන් නොවේ. ගැටුම් අවසන් වූ පසු සමාජය තුළ බිය, සැකය, අවිශ්වාසය, ශාරීරික තුවාල සහ මානසික තුවාල දිගු කාලයක් පවතියි. කතෝලික සභා ඉගැන්වීම්වලට අනුව ජීවිතය දෙවියන් වහන්සේගෙන් ලැබුණු තිළිණයකි. එවැනි ජීවිත ත්‍යාග විනාශ කරන්නට කිසිවකුට අයිතියක් නැත. ජීවිත විනාශ කිරීම අපරාධයකි; පාපයකි.

යුද්ධයක් බොහෝ විට දේශපාලන නායකයන්ගේ අහංකාර, ඒකාධිපති, අසාධාරණ තීරණ නිසා ආරම්භ වේ. ඒ නිසා අහිංසක දිළිඳු ළමුන්, තරුණ, වැඩිහිටි, මහලු මේ ආදී දහස් ගණනින් ජනතාව දුකට පත් වී අසරණ තත්ත්වයකට පත් වේ.

ක්‍රිස්තු විශ්වාසකයන්ගේ ආකල්පය සහ දැක්ම විය යුත්තේ යුද්ධය නොව සාමය ගොඩ නඟන මග පෙන්වීම ය. **"මනුෂ්‍යත්වය ගොඩ නැඟීමට අපට ඇති පිපාසය සහ වුවමනාව පළිගැනීමේ වුවමනාවට වඩා පුළුල් පරාසයකට යා යුතු ය. වෛරයට සහ මරණයට වඩා ආදරය සහ ජීවිතය අතිශයින් ම ප්‍රබල ය"** (පුබුදිත හෙළිදරව්ව පිටු අංක 185).

කන්ද උඩ දේශනයේ දී ක්‍රිස්තුන් වහන්සේ පවසන්නේ **"සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය යි කියනු ලබන්නෝ ය"** (මතෙව් 5:9).

ශුද්ධ වූ අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමන්ගේ සාමය සම්බන්ධව අවබෝධය අප සිත් සතන් පහන් කරයි.

**"ස්වාමිනී, මා ඔබගේ සාමයේ උපකරණයක් කළ මැනව. වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය ද, අසමගියේ තුවාලයන්ට ශාන්තියේ සුවය ද, ... "**

**"සැනසීම ලැබීමට වඩා සැනසීම දීමට ද, තේරුම් ගනු ලබනවාට වඩා තේරුම් ගැනීමට ද, ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේම කිරීමට ද මා යොමු කළ මැනව. මක්නිසාද, දීමෙන් ලැබීමත්, සමාව දීමෙන් සමාවත්, මරණයෙන් අපට සදා ජීවිතයේ ඉපදීමත් අත්වන හෙයිනි."**

අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා ක්‍රිස්තු ආකල්පය පෙරදැරි කරගෙන ආධ්‍යාත්මික ජීවිත පෙරලියක් කළ යුග පුරුෂයෙකි. එතුමා ආලෝකමත් වූ පහන් සිතුවිලි සහ ආධ්‍යාත්මික චින්තනය ක්‍රෝධය, වෛරය වපුරා යුද්ධවලට ජනතාව මෙහෙයවන කොයි කාටත් හදවත් ස්පර්ශ කරන මහා පණිවුඩයක් ඒ තුළ අන්තර්ගත ය. මිනිසුන් අතර ඇතිවන ඕනෑම ගැටුමක්, භේද බින්න වීම, කෝලහාල, යුද්ධ අවම කරන්නට හෝ නැති කරන්නට මේ චින්තනය පහන් ටැඹකි. අවාසනාවකට මෙම පහන් සිතුවිලි සිත් පහන් කර ගන්නට උපයෝගී කර ගන්නවා ද යන්න අප ඉදිරියේ ඇති අභියෝගය යි.

නොවැම්බර් මාසයේ දී විශේෂ ආකාරයෙන් අපෙන් සමුගත් අප ආදරය කළ අය සිහිපත් කරමු. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරමු. "ස්වාමිනී නිත්‍ය සැතපීම ඔවුනට දුන මැනව. නිත්‍යා ලෝකය ඔවුන් මත බැබළේවා. ඔවුන් සමාදානයේ සැතපේවා". සමාදානය ජීවතුන්ට පමණක් නොව මළවුන්ට ද අපි ප්‍රාර්ථනා කරමු.

සැබෑ සාමය, සමාදානය ලොවට ගෙනා සාමයේ කුමාරයාණන්ගේ උපත සිහිපත් කරන්නට අපි ළඟි ළඟියේ තව ටික දවසකින් සූදානම් වෙමු. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මිහිමත උපතේ මංගල්‍යය විවිධාකාර මානවලින් බලා අපට සන්තෝෂ විය හැකි ය. එහෙත් එය හුදෙක් බාහිර ආටෝපයන්ගෙන් පිරි සතුටකට පමණක් බොහෝ අය ලඝු කරති. එනමුත් සැබෑ සාමයේ පණිවුඩය මිනිසුන් ජීවත් කරවන මඟකි. සැබෑ ශාන්තිය, සාමය ක්‍රිස්තුන් වහන්සේ අපට ප්‍රදානය කරන සේක.

**"ශාන්තිය ඔබ වෙත ප්‍රදානය කර යමි. මාගේ ශාන්තිය ඔබට දෙමි. මා එය ඔබට දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ"** (ජොහන් 14:27).

ඇත්තෙන්ම සැබෑ සාමයේ පණිවුඩය මිනිසුන් ජීවත් කරවන මඟකි. එය මිනිසුන් අතර සහජීවනය ඇති කරයි. "සීනු හඬින්" යන නත්තල් ගීතයේ අහසට පොළොව ගැටේ යයි ගරු මර්සලින් ජයකොඩි නි.ම.නි. පියතුමා පවසයි. අහස පොළොව එකට සම්බන්ධ නොවේ. නමුත් ක්‍රිස්තු උපත අහස පොළොව එකට එකතු කරයි. පරස්පර විරෝධී මත ක්‍රියා එකට සහජීවනයෙන් බැඳේ. මිනිසා සහ දෙවිඳුන් එකට වාසය කරන්නට කූඩාරම් ගසා ගත් අවස්ථාවකි. දෙවිඳුන්ගේ කොන්දේසි විරහිත ආදරය සමඟ මනුෂ්‍යයා පාපයෙන් මිදෙන අවස්ථාවකි. එනම් දුප්පත් පොහොසත් පරතරය අඩු කරන මඟකි. ගිලනුන්ට සහනය සුවය ගෙනෙන මඟකි. වහල්කමට නිවහල්කම හමුවේ. අන්ධකාරයට ආලෝකය හමුවේ.

"නත්තල" සාමයේ ජේසු සමිඳාණන් උපතේ මහිමාලංකාරය ලොවට ප්‍රත්‍යක්ෂ වන සංසිද්ධිය යි. ගැලවුම්කරුවාණන් ලොව වඩින දින යි. ඒ ගැලවුම අපගේ ජීවිත අත්දැකීමක් වීමට නම් සැබැවින්ම නත්තල අනවශ්‍ය වියදම්වලින් මුදා, අවශ්‍ය දේ තෝරා ගනිමින් සතුටින් ජීවත් වීමට මග සලසන මංගල්‍යයක් විය යුතු ය. බේබදුකම, විලාසිතා, සන්ඩු සරුවල්, අනිසි විවාද, වෛරය, පළිගැනීම, වැරදි පුරුදු, ස්මාර්ට් දුරකථනයට, සූදුවට, අසැබි ක්‍රියාවන්ට වහල්වීම, දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය දෙදරවන වහල්කමින් මුදවා අප ගලවන ගැලවුම්කරුවාණන්ගේ මඟ පෙන්වන තාරකාව ඔස්සේ පියමං කරන්නට ඔබටත් මටත් දේව ප්‍රඥාව ලැබේවා.

**සංස්කාරක පියතුමා**

# ගිනි අතරින් පිපෙන සාමය...

ලෝකයේ ආරම්භය කිනම් ද?
එය ආරම්භ වූයේ ආදරයේ නාමයෙන්,
සාමයේ මල් වැල් හටගන්නට යි...
නමුත් මනුස්ස සිත් තුළ,
වෛරය, පළිගැනීම හටගද්දී,
ඒ මල් වැල් ගිනි තබනවා වැනියි...
අද ලෝකය යන්නේ අඳුර කරා නොවේ ද?
යුද බිම්වල කඳුළු සලන මිනිස්සු,
ගිනි ගැස්සෙන නගර,
බිඳුණු පවුල්වල හැඬුම්,
අහිංසක දරුවන් උහුලන කුසගින්න,
තරුණ තරුණියන්ගේ බිඳුණු සිහින,
පුවත්පත් පිරී යන අඳුරු කතා,
රටවල් අතරේ සිදුවන බෝම්බ ප්‍රහාර,
මාධ්‍ය තුළ පැතිරෙන අඳුරු තාරකා,
අනුවණ වචන, වෛර පණිවිඩ,
දේවස්ථාන තුළත් කඳුළු බිඳෙන අයුරු...
ඔව්, මැවුම්කරු බලාපොරොත්තු වුණ,
සමඟිය බිඳෙනවා, සෙනෙහස මැකෙනවා...
මනුස්සයාගේ සිත තව තවත් දැවෙනවා...
නමුත් මෙය නොවේ අවැසි සාමය ලොවට,
එය හදවත තුළින් පැමිණෙන ආලෝකයේ ගීයක් වැනියි...
අපට කරන්නට හැකි දේ හරිම සරලයි,
අනෙකාගේ වේදනාව තේරුම් ගන්නට, එය බෙදා ගන්නටයි...
සාමය පවතින තැන මිනිසුන් හිනා වෙයි හදවතින්...
දරුවන්ගේ සිත් සතන් සැනසෙයි...
තරුණ තරුණියන් පාදා ගනීවි ඔවුන්ගේ අනාගතය...
අපේ අරමුණ විය යුත්තේ,
යුද්ධ, ප්‍රහාර රහිත ලෝකයක්...
සෙනෙහසින්, සාමයෙන් පිරුණු මිනිසුන්...
අප එය තනන්නට අපගේ වැර යොදමු...

**ගරු කීර්ති සඳරුවන් ප්‍රනාන්දු නි.ම.නි. සහෝදරතුමා,**
**නි.ම.නි. දෙව්සත්හල, අම්පිටිය.**

# නොමැති තැණ සාමය ඇවිලෙනු ඇති පාපය...

"ඊශ්‍රායල - පලස්තීන යුද ගැටුමෙන් මරණ පන්දහසකට ආසන්න ප්‍රමාණයක් වාර්තා වේ. අතුරුදන් වූ පිරිස තවමත් අවිනිශ්චිත ය."

- පළ වූ සිරස්තලයක් -

මීට ස්වල්ප දිනකට ප්‍රථම රූපවාහිනී නාලිකා සියල්ලන්ගේ ම පාහේ වාර්තා වුණු ප්‍රධාන පුවත් අතර ඉහළින්ම තිබුණේ ඊශ්‍රායෙල - පලස්තීන යුද ගැටුම යි. මෙම යුද ගැටුමට මූලික වූ ප්‍රධාන හේතුව නම් කුමක් වන්නට ඇත් ද? සත්‍ය වශයෙන් ම බල තණ්හාව නම් නොවේ ද? තමන්ට වඩා, තමන්ගේ රාජ්‍යයට වඩා තව කෙනකු හෝ තවත් රාජ්‍යයක් දියුණු වන අකමැත්තට අමු අමුවේ මිනිස් ජීවිත විනාශ කර දමමින් නටඹුන් ගොන්නක රජකම දැරීමේ ඇති ඵලය කුමක් ද? දස පණතේ පස්වන පණත එළිපිට විනාශ කර දැමීම තුළ බලාපොරොත්තු විය හැකි සතුටක් තිබේ ද? අප සැවොම සෙවිය යුත්තේ මෙයට හේතුවක් සහ එයට පිළියමකි. "මම - මගේ" යන සංකල්පය තුළ ජීවත් වන වර්තමානයේ බොහෝ දෙනකුට නොමැති, නමුත් අත්‍යවශ්‍යයම වන එක් ගුණාංගයක් තිබේ. එය නම් 'සාමය' යි. මමත්වය, ඊර්ෂ්‍යාව රජ කරන තැන සාමයට කිසිඳු ඉඩක් නොමැත. එම අන්ධකාර අවකාශය සාතන්ගේ බල අඩවියකි. බොහෝ දෙනා හසු වී, අතරමංව ඇති එම අන්ධකාර අඩවියට ආලෝකය ගෙන ආ හැක්කේ 'සාමයේ අරුණලු' වලට පමණම ය. හිත් තුළ වූ මමත්වය පසෙකට ලා අපි සාමයේ අරුණලු වැළඳගන්නට උත්සාහ කරමු.

"සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යි කියනු ලබන්නෝ ය" (මතෙව් 5:1). නිතර කනට ඇසෙන, ඇසට පෙනෙන මෙම අක්ෂර ත්‍රිත්වයේ අර්ථය නම් කුමක් වන්නට ඇති ද? පුරාණ ගිවිසුමේ 'සාමය' යන වචනය සඳහා හෙබ්‍රෙව් වචනය "ෂාලොම්" ලෙස අර්ථ ගන්වයි. එහි අර්ථය නම් 'ඇතුළාන්ත සාමය' යි. එසේ නම් සාමය හා පාපය අතර ඇති සම්බන්ධය කුමක් වන්නට ඇති ද? හෙබ්‍රෙව් අර්ථයෙන් බැලූ කල, එදිනෙදා ජීවිතයේ අප එකිනෙකා මමත්වය මෙන්ම බලය තුළ රජ කරවන්නට උත්සාහ දරනවා නොවේ ද?

- පෙරදිනට වඩා අද දින සාධාරණව හෝ අසාධාරණව වැඩිපුර මුදල් ඉපැයීම
- තම තනතුර රැක ගැනීමට කළ හැකි සියලු පහත් දේ සිදු කිරීම
- තමන්ගෙ හොඳ නමට තව කෙනකුට මඩ ප්‍රහාර එල්ල කිරීම

මෙලෙස අප අපගේ සිත් සමඟ ම බල අරගලයක යෙදී සිටිනවා නොවේ ද? මේ තුළින් අපගේ ඇතුළාන්ත සාමය අමු අමුවේ විනාශ වී යන බවට නම් නො රහසකි. සාමය විනාශ වීම හමුවේ පාපය රජ කරමින් අප හා දෙවියන් වහන්සේ අතර ඇති ගැඹුරු ආදරණීය සම්බන්ධයට තිත තැබීමට නියත ලෙස ම උත්සාහ දරයි. රටේ යුද්ධ, ලෝක යුද්ධ පිළිබඳව විමසුමට පෙරාතුව සාතන් සමඟ අපගේ ඇතුළාන්තයේ අරඹා ඇති යුද්ධය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. මන්දයත්, සාතන් රජ කරන තැන, සත්‍යයට, යුක්තියට, ප්‍රේමයට හා නිදහසට ඉඩක් නැත. එසේ නම් අපගේ පියවර විය යුත්තේ කුමක් ද?

- චෝදනා හමුවේ සත්‍යයට සාක්ෂි දීමට හැකි නම්,
- වෛරය වෙනුවට මෛත්‍රීය දැක්විය හැකි නම්,
- මමත්වය වෙනුවට බෙදා ගැනීම ප්‍රගුණ කළ හැකි නම්,

ඒ සෑම දේ තුළ ම සාමයේ කුමාරයාණන්ගේ පණිවුඩය අන්තර්ගත ය. එනම්, "ප්‍රේම කරන්න

ඔබට වෛර කරන්නන් හටත්" යන්න ය.

වර්තමාන සමාජයේ බොහෝ දෙනා විවිධ අසරණකම් තුළ සිර වී, විවිධ ඇබ්බැහිකම් තුළ සිර වී ජීවිතයේ තෘප්තිය වෙනුවට අසතුට, අසමගිය අත්දකින බව නම් නො රහසකි. තම නිලතල, තම බලය කර ගත් බොහෝ දෙනා අසරණ දුප්පත් දුගී ජනයාව පහත් කොට සලකනුයේ, සෑම බලයකම අයිතිකරුවාණන් කිතු රජිඳුන් බව නොදන්නාකම නිසා ය. මුදල් තමන්ගේ ජීවිතය කර ගත් බොහෝ දෙනා අසරණව කල් ගෙවනුයේ, ඇතුළාන්ත සාමය ඔවුන් තුළ නොමැති නිසා නොවේ ද?

- එදා පේදුරුට, මාළුන්ට සහ මුදල්වලට වඩා ජේසුගේ වටිනාකම දැනුණා.
- තෝමස් තමන්ගේ අවිශ්වාසයට වඩා ජේසුගේ ආදරය විශ්වාස කළා.
- මරිය වහන්සේ තමන්ගේ සැලසුම් එපා කියා දේව සැලසුමට හිස නැමුවා.
- ජුසේ වඩුවා තමන්ගේ සිහින මාලිගා කඩා දමා ශු. පවුල ගොඩ නැගුවා.
- ඩිෆ්නා මුනිවරිය තමන්ගෙ රූපයට වඩා ජේසුට ආදරේ දෙද්දී,

උන්වහන්සේ මේ සියල්ලන්ට ම වටිනා තිළිණයක් පොරොන්දු වූ ලෙසම දානය කළ සේක. එනම්, ස්වර්ගයේ දී දේව පුත්‍ර භාවයට උරුමකම් කීමේ වරය යි. කිතුනුවන් වන අපට ද, එම සැබෑ උරුමයේ අයිතිකරුවන් බවට පත් විය හැක. නමුත් එයට අප සුදුසුකම් කිහිපයක් සපුරාගත යුතු ය.

- පළිගැනීම වෙනුවට සාමය
- කෝපය වෙනුවට ඉවසීම
- ගැරහීම වෙනුවට ආදරය

ඔබටත් හැකි නම් මෙම සුදුසුකම් සපුරාලන්නට සාමය ඇති තැන පාපයට ඉඩක් නොමැති වෙයි. එනම් ඔබටත් ස්වර්ගීය දේව පුත්‍ර භාවයේ උරුමය අත්විඳිය හැකි ය. ඒ සඳහා අප සැවොම වැය වෙමු; කැප වෙමු.

"ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න" (මතෙව් 5:44).

වචනයට පමණක් සීමා නොවූ මෙම උතුම් ඉගැන්වීම කපාල පිටියේ දී කළ හැක්කක් බව උන් වහන්සේ අපට පෙන් වූ සේක. කිතුනුවන් වන අපටද උන් වහන්සේ ඇරයුම් කරන්නේ, ආදරයට පමණක් ආදරය නොකර, වෛර කරන්නන්ට ද ආදරය කරන ලෙස යි. එමගින් අපට, ඇතුළාන්ත සාමය උපරිමයෙන් විඳිය හැකි නොවේ ද? එතැනට සාතන්ගේ අඳුරු බලවේගවලට ඇතුළු විය නොහැක. සාතන්ගේ බලය බිඳුණු තැන, පාපයට තිත තැබිය හැකි ම ය. පුරාණ ගිවිසුමෙන් පැමිණි සාතන්ගේ බලය නව ගිවිසුමේ මරිය වහන්සේගේ කැඳවීම තුළ බිඳ හෙළන්නට දේව තාත්තා කැමති වූවත්, සාතන් එයට ද, ප්‍රහාර එල්ල කළේ දේව සම්බන්ධකමට තිත තබන්නට ය. නමුත් සාමය ඇති තැන සාතන්ගේ සියලු ක්‍රියා බල රහිත ය. උත්සාහ කරමු අපත්, කිතු සමිඳාණන් පා මග ගමන් කරන්නට. ගැටලුවලට නොසැලී, ඉවසීමෙන්, පටු දොරටුවෙන් ඇතුළුව ස්වර්ගය සොයමු. එවිට අපට පාපයට තිත තබා, සාමයේ පහස විඳිය හැකි ම ය.

"සැනසීම ලැබීමට වඩා සැනසීම දීමට ද, තේරුම් ගනු ලැබීමට වඩා තේරුම් ගැනීමට ද, ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේම කිරීමට ද මා යොමු කළ මැනව..." (අසීසියේ ශු. ෆ්‍රැන්සිස් තුමාගේ සාමයේ යැදුම)

එසේ නම්, නිවමු පාපයේ ගිනි. අවුලමු සාමයේ පිනි.

**බුද්ධික සඳරුවන්**
**දළුපත, ශා. අන්තෝනි සිද්ධස්ථානය.**

# ජීවිත සුරක්ෂිත ග්‍රාමය වඩවමු

මාග්‍රට් මීඩ් ලොව සුපතල මානව විද්‍යාඥවරියක්. ඇය විශ්වවිද්‍යාල සිසුන් පිරිසක් සමග කළ දේශනයකින් අනතුරුව යම් පැහැදිලි කර ගැනීම් අවශ්‍ය සිසුන් හට ඊට අවස්ථාව සලසා දුන්නා. එක් ශිෂ්‍යයෙක් නැගිට ඇයගෙන් විමසුවා "මහත්මිය ඔබ සිතන ආකාරයට මනුෂ්‍යයා තමන්ගේ ග්‍රාමය, සත්ව ස්වභාවයෙන් මිදී, සදාචාරවත් තත්ත්වයට පත් වුණේ ලෝක ඉතිහාසයේ කුමන නිශ්චිත මොහොතේ ද?"

පිළිතුරු දීම වෙනුවට ඇය මෙම පැනය පෙරලා සිසුන් වෙතට ම යොමු කළා. එක් ශිෂ්‍යයකුගේ පිළිතුරු වුණේ 'මනුෂ්‍යයා තම ආහාර අමුවෙන් කනවා වෙනුවට එය පිසීමෙන් පසුව අනුභවයට ගත් අවස්ථාව' බව යි. තවත් ශිෂ්‍යයකු පැවසුවේ දඩයමෙන් ජීවත් වුණු මානවයා කෘෂිකර්මය තමන්ගේ ජීවනෝපාය බවට පත් කර ගත් අවස්ථාව බව යි. සියල්ලට ඇහුම්කන් දුන්නු මාග්‍රට් මීඩ් පැවසුවේ "මම විශ්වාස කරන ආකාරයට එය කැඩුණු කකුලක් සුව වුණු මොහොත" බව යි. එය තවත් ප්‍රශ්න ගණනාවක් ඇය වෙත යොමු කෙරෙන පිළිතුරක් වුණා.

මාග්‍රට්ගේ පැහැදිලි කිරීම වුණේ කැලයක ජීවත් වෙන තිරිසන් සතෙකුගේ අස්ථියක් බිඳීම යනු උගේ ජීවිතයේ අවසානය යි. එතැන් පටන් ඌට තමන්ගේ ආහාර කොටස සොයාගන්නට හැකියාවක් නැතිව යනවා. එවිට ඌ සාගින්නෙන් හෝ තවත් විලෝපිකයෙකුගේ ප්‍රහාරයකින් මරණයට පත් වෙනවා. නමුත් කැඩුණු කකුලක් සුව වීම යනු එම විපත වුණු පුද්ගලයාට තව කණ්ඩායමක පිළිසරණය ලැබීමක්. කවුරුන් හෝ ඔහුව ඔසවා ආරක්ෂිත ස්ථානයකට ගෙන යා යුතු යි. ප්‍රතිකාර කළ යුතු යි. පෝෂණය කළ යුතු යි. මෙය සත්ව ලෝකය තුළ දක්නට නොහැකි සීලාචාර සමාජයක පමණක් දක්නට හැකි ලක්ෂණයක්.

මාග්‍රට් මීඩ්ගේ පිළිතුර අප පිළිගත්තා හෝ නොපිළිගත්තා මනුෂ්‍යත්වයේ හා සදාචාරවත් බවේ මුදුන් මුල වන්නේ සහෝදර දයාව යි. කරුණාව හා දයාව අපව සහකම්පනයෙන් යුතු ශිෂ්ටවත් මිනිසුන් බවට පත් කරනවා. මුදුන් මුල අහිමි කළ ගසක වැඩීම බාල වී ඉඩෝර කාලයකට මුහුණ දිය නොහැකිව මැලවී යනවා සේ සහකම්පනය නොමැති සමාජයක් ලොව තුළ කෙමෙන් වියැකී යනවා.

මානව ඉතිහාසය බොහෝ යුද ගැටුම් වලින් ගහන වූවක්. බලය පැතිරවීමට, තම සුඛ විහරණය වෙනුවෙන් අන් ජාතීන් මංකොල්ලකෑමට, වහල් ක්‍රමය නඩත්තුවට, තම දේශනපාලනය / ආගම ජාතිය වැනි ස්වෝත්තමවාදී අදහස් පෙරදැරි කොට ගැනීම ආදී පටු අරමුණු වෙනුවෙන් මිනිසුන් එකිනෙකා මරාගෙන තිබෙනවා. යුද්ධයක් අවසානයේ දී ඉතිරි වන්නේ විනාශය පමණක් බව ඉතිහාසය සාක්ෂි දරනවා. ලෝකයේ කුමන කලාපයක සිදු වූවත් යුද්ධයකින් අනතුරුව එළැඹ ඇත්තේ විශාල මානව අර්බුදයක්. යුද්ධයක දී මනුෂ්‍ය ජීවිත යනු නොම්බරයක් පමණයි. එහෙත් නැතිවන සෑම ජීවිතයක් ම කාගේ හෝ දරුවෙක්, සොයුරෙක්, මවක් හෝ පියෙක්. අහිමිවන එක ජීවිතයක් සමග තවත් ජීවිත ගණනාවක් දෙදුරුම් කනවා. බොහෝ විට ඒවා කිසිදා සුව නොවන තුවාල මෙන් සමාජ දේහයේ රැඳී පවතිනවා. යුද්ධයක් සමග සමාජය තුළ ඇති වන අනාරක්ෂිත මානසිකත්වය හා එකිනෙකා දෙස සැකයෙන් හා ද්වේශයෙන් බැලීමේ ප්‍රවණතාව යුද්ධය භෞතිකව අවසන් වූවත් නිමාවට පත් වන්නේ නැහැ. එය තවත් අනාගත ගිනි ඇවිලීමට අළු යට සැඟවී පවතිනවා.

අද ක්‍රියාත්මක වන රුසියානු හා යුක්‍රේන අර්බුදයත්, ගාසා සංහාරයත්, අප මුහුණ දුන් තිස් අවුරුදු සිවිල් යුද්ධයත් පසක් කරන්නේ මේ යථාර්ථය යි. යුද්ධයක් තුළ ජයග්‍රාහයකයන් නොමැති අතර එය මුළු මහත් ජන වර්ගයම

පරාජිත අමන ස්වභාවයකට පත් කරනවා.

අද අපි ජීවත් වෙන්නේ විශ්ව ගම්මානයක බවත්, තාක්ෂණයෙන් දැනුමෙන් පිරි ලොවක බවත් බොහෝ දෙනා පාරම් බානවා. එහෙත් එවැනි ලෝකයක් තුළත් වර්තමානයේ මිනිසුන් අන්ධයන් මෙන් යුද්ධයට ආවැඩීමටත් එකිනෙකා සමග යුධ වැදීමටත් කටයුතු කිරීම පසක් කරනුයේ මිනිසා තවමත් තමාට ළඟාවිය හැකි සදාචාර සීමාවෙහි එළිපත්තටවත් පැමිණ නොමැති බව යි.

ලොව සමහර ජාතීන් තම අතීත අඳුරු අත්දැකීම්වලින් පාඩම් ඉගෙනගෙන වර්තමානය තුළ ඉතා ගුණාත්මක ජීවිත තම පුරවැසියන්ට උරුම කර දී තිබෙනවා. එවැනි රටවල් ප්‍රචණ්ඩත්වය හැකිතාක් බැහැර කර මානව අයිතීන් තම රට තුළ ආරක්ෂා කරන්නට විශාල වෙහෙසක් දරනවා. දරුවන් කුඩා වියෙහි පටන් සහකම්පනයෙන් යුත් පුරවැසියන් ලෙස ගොඩ නැගීමට අධ්‍යාපනය සකස් කොට තිබෙනවා.

සාමය නොමිලයේ ලැබෙන දායාදයක් නොවේ. ඒ සඳහා අධික මිලක් ගෙවිය යුතුව තිබෙනවා. එකිනෙකා තනි තනිවත් සමූහයක් ලෙසත් ලොව සියලු ජාතීන් සාමකාමී ලොවක් වෙනුවෙන් වෙහෙසිය යුතු යි. විශේෂයෙන් යුද්ධයේ හා කලකෝලාහලවල සුව නොවූ තුවාල සහිතව සිටින ශ්‍රී ලාංකීය සමාජය විෂයෙහි ලා එහි පුරවැසියන් වන අප මහත් පරිශ්‍රමයක් දැරිය යුතු යි. මානව හිමිකම් සුරැකීම, අපරාධ හා දූෂණයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම, සමාජ සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කිරීම, පොලීසිය හා නීති අංශ මහජන මිත්‍රශීලි ආයතන බවට පත් කිරීම, රාජ්‍ය ආයතන විනිවිද භාවයෙන් හා කාර්යක්ෂම භාවයෙන් සන්නද්ධ කිරීම වැනි බොහෝ සාධනීය පියවර අනුගමනය කළ යුතු යි. ඉහත තත්ත්වයන්ගෙන් තොර රටක කිසිදා සාමය උදා කළ නොහැකි යි.

අප රටත් සාමයේ අගය හඳුනාගත්, සාමය සුරකින රටක් බවට පත් කිරීම අප සැම හමුවේ පවතින විශාල අභියෝගයක්. එය විදේශයකින් ආනයනය කළ හැකි හෝ ණයට ඉල්ලා ගත හැකි දෙයක් නොවේ. පුරවැසියන්ගේ ආකල්ප සංවර්ධනය තුළින් හා පුද්ගල ජීවිත ගුණාත්මකව වර්ධනය කිරීම තුළින් පමණක් ජය ගත හැකි සටනක්. මෙම උදාරතර වගකීම වෙනුවෙන් අප සැම දෙනා කැප වෙමු; වැය වෙමු.

**ගරු රොෂෙල් ගුරුසිංහ පියතුමා,**
**ශු. ජුසේවාස් එඩේරික මධ්‍යස්ථානය,**
**පුත්තලම.**

## යුද්ධය පරදා සාමය සුරකිමු

ධනය බලය තණ්හාවයි ලොව රජයන්නේ
ඒ වෙනුවෙන් මිනිසත්කම පූජා කරන්නේ
ජීවිත වනසන යුද්ධය ඉන් ඇරඹෙන්නේ
අහිමිවීම් සුසුම් ලැම් ඉතිරි කරන්නේ

යුද රකුසා අප දේශය වෙත විත කෙරුවා
මරණ බයෙන් අසරණ අපි කඳුළැලි බිව්වා
අප දරුවන් රැක දෙන්නයි ජේසුට කිව්වා
හැම මොහොතෙම දෙව් අම්මගෙ සරණය සෙව්වා

සාමය ගැන කියා දුන්නෙ දෙව් පුත් පමණයි
සුරකින්නට ජීවිත ඇති මග සමාව දීමයි
ප්‍රේමයෙ සුබ වදන සැමගේ හදවත් සනසයි
පාපයෙ සතුරා පරදා සතුටින් ඉන්නයි

ජාති භේද කුලමල සැම අත්හැර දමමු
ජීවිත වනසන යුද්ධය නිති පිටු දකිමු
ජීවිත සුරකින සාමය පතමින් යදිමු
සුදත් සුරිඳු වරම් ලබා ප්‍රේමෙන් සිටිමු

**අයිරින් කොස්තා**
**කඳවල.**

# නො ඇවිලිය යුතු ගිනි



මා මේ කථාව ඔබට කියන්නේ පරාජිතයෙක් ලෙසටමත් නොවේ. නමුත් මා මේ කුරුළු දූපතේ ඇවිලුණු යුධ ගිනිවලට වගකිව යුත්තෙක්මි. මං එදා ඒ තීරණය නොගත්ත නම් ඇතැම් විට මා මීටත් වඩා සතුටින් සිටිය යුතු ය. ඒත් තවමත් ගිනි ඇවිලෙන කුරුළු දූපත් ජීවිතය නැමැති ලිපි ගොනුව මා වසා දැමුවේ මීට සතියකට පෙර යි. ඒ මතක ගිනි අඟුරු අවුස්සා පාවෙන අළු කැබලි දෙස බැලීමට වත් මාගේ කැමැත්තක් නොවේ. මා වර්ෂ අවුරුදු 2005 දී කුරුළු දූපතේ උපත ලැබුවෙමි. ඒ යුද ගිනි ඇවිලෙමින් තිබිය දී ය. මා කෙමින් කෙමින් වයසින් වැඩි වූයේ අම්මාගේ බලාපොරොත්තු සහ අරමුණු මල්ඵල ගන්වමිනි. යුද ගිනි පුපුරු මැද මම කෙසේ හෝ මාගේ අධ්‍යාපනය අත්නැරම කරගෙන ගියෙමි. නමුත් එක් උදෑසනක සිදුවීමක් මාගේ කුරුළු දූපත් ජීවිතය නැමැති වසර 20ක සුන්දර සිත්තම් මැදට කළු සුදු චිත්‍රයක් එක් කිරීමට සමත් විය.

ඒ උදෑසන මා අවදි කිරීමට හේතුව වූයේ යමෙක් විසින් දොරට තට්ටු කරන හඬ යි. මාගේ අම්මා විගසින් නැගිට දොර ඇරියේ ආචාර කරමිනි. කථා වූ දේ පැහැදිලි නොවූවත් කසුකුසුවෙන් පෙනී ගියේ අනතුරක සේයාව යි. නැවතත් දොර වසන ශබ්දය යි. ටික වෙලාවකට වත් අම්මා මා ඉදිරියට පැමිණ මා ඇමතුවා ය.

"පුතා දැන් ඔයා අවුරුදු විස්සක දරුවෙක් නේ. ඒක නිසා ඔයා දැන් යුද පුහුණුවට යන්න වෙලා පුතේ" ඇය දිග සුසුමක් හෙළුවා ය. "මං දන්නවා ඔයා යුද්දෙට කැමති නෑ කියලා. ඒත් අපිට තියෙන්නේ සතිය යි පුතේ. මං කැමති නෑ ඔයා මේ යුද්ධවලට සහභාගි වෙනවාට". මටත් මේ කිසිම දෙයක් අදහාගත නොහැකි විය. "අම්මා මං දැන් මොකද කරන්නේ? ලබන සතියේ මට විශ්වවිද්‍යාලයට යන්න ඕනි" මම යුද්ධයට වෛර කරන්නෙක් වෙමි. එය මට මහත් හිසරදයකි. " ඔව් සුජාන් මට ඔයාගේ තත්ත්වය තේරුම් ගන්න පුළුවන්. ඒත් මේක රටේ නීතිය පුතා". ඇය මට මහත් සැනසුමකි. "අම්මා මං එතකොට ලබන සතියේ යුද පුහුණුවට යනවා ද?" "ඔව් පුතා, බය වෙන්න එපා ඔයාට ඉක්මනින් එන්න පුළුවන් වේවි". කෙසේ වෙතත් මට යුද පුහුණුවට නොයා සිටීමට නොහැකි විය. මාස 10ක් තුළ ලැබිය හැකි හොඳම පුහුණුව මම ලැබුවෙමි. නමුත් මට ලැබුණේ මා සිතුව තරම් අමාරු රැකියාවක් නොවේ. කුරුළු බණ්ඩයේ හමුදා සෙබළුන් දිරිමත් කිරීමට හොරණෑව පිඹීම යි. මා අති දක්ෂ ලෙස ඒ රැකියාව කළෙමි. නමුත් යුද ගිනිවලට මාගේ අකැමැත්ත තවත් වර්ධනයක් මිසක අඩුවක් නම් නොවීය.


කෙසේ වෙතත් ඒ මා කීවේ මීට මාස දහයකට පෙර මා සතු මතකයන් ය. ඉන් පසු සිදු වූ සිදුවීම මීට වඩා හාත්පසකින් ම වෙනස් ය. මේ සිද්ධිය වූයේ මීට සතියකට පෙර යි. ඒ සිද්ධිය නම් යුද්ධය නිසා විඩාබර දෑස් සමඟින් මා කඳවුරේ නින්දට ගියෙමි. මැදියම් රෑ පසු වී පැය භාගයක් ගියේ නැත. කඳවුරෙන් පිටත ඇසුණේ මහත් ඝෝෂාවකි. ප්‍රහාරයක් බලාපොරොත්තු නොවූ මොහොතක ප්‍රහාරයක් පැමිණි නිසාත්

මට තිබූ විඩාව නිසාත් මට වැඩි දුරක් දිවීමට නොහැකි විය. සතුරු රාජාලියන් යටතට මා පත් විය. ඔවුන්ගේ කඳවුරු වෙතට මා රැගෙන ගියේ වරදක් කළ බලලෙකු උස්සන් යන්නාක් මෙනි. එදා මැදියමේ සිටම මට නින්දක් නොමැත. විලංගු දමා හටයන් කිහිපයක් මා ළඟ තබා ඇත. ඇදීමට අවශ්‍ය අවසාන ඉත්තන් ඇදීම මාගේ බලාපොරොත්තු විය. ඉන්පසු මා ළඟට රාජාලි නායකයා පැමිණියේ ය. ඔහු පැමිණි විගස මං විලාප දීමට පටන් ගත්තෙමි. ඔහු ආචාරශීලි ලෙස මට ඇමතුවේ ය.

"අනේ මට යන්න දෙන්න. මං කළේ හොරණෑව වාදනය කිරීම පමණයි". මුලින්ම ඔහු මාව නිදහස් කිරීමට අකැමති විය. මම නැවත නැවතත් ආයාචනා කළෙමි. එම නිසා ඔහු මාව රටින් පිටුවහල් කිරීමට කැමති වූයේ ය.

"ඇත්තටම ඔබ තමා භයානකම රස්සාව කළේ ඔබ තමා නිවී යන ගිනි අඟුරුවලට පවා පිඹ ගිනි ජාලාවක් බවට පත් කළේ නමුත් මා කැමැති නෑ ඔබ වගේ තරුණ ජීවිත විනාශ කරන්න. ඒ නිසා මම අණ කරනවා ඔබව පෙරදිගට පිටුවහල් කරන ලෙස" සත්‍ය වශයෙන්ම මට අවශ්‍ය වූයේ එය යි. මා දැන් පෙරදිගට යාත්‍රා කරමින් සිටිමි. ඒ පිළිබඳව මට ඇත්තේ කියා නිම කළ නොහැකි සතුටකි. සදහටම දෙනෙත් පියා ගන්නට පෙර සාමයෙත් දවසක් හෝ ගත කිරීම මාගේ කැමැත්ත යි. මා දැන් මේ කුරුලු දූපත් ජීවිතය නැමැති ලිපි ගොනුව වසා දමා අවසාන යි. එය නැවත දිග ඇරියත් එහි සිතුවම් පිරවීමට මම පිළිකුල් කරන්නෙමි. පෙරදිගට ගොස් කුමක් හෝ රැකියාවක් කර මා ජීවිතය නැවතත් ගොඩ නඟා ගන්නෙමි.

**පූර්ණි නතාෂා**
**9 ශ්‍රේණිය,**
**ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කළුතර.**



# මිහිතලය ම දෙව් විමනක් වී

විලාප ගී ඇසෙනා ලොවේ
නුවණින් ගලා හැලේ කඳුළු බිඳු
ගිනි ජාලා සැම අතේ සිත් කම්පා වෙනා
ගඟන පුරා විසිරී සෝ සුසුම්
වෙන් වෙලා පවුල් පොළෝ තලයේ
සොයා ගත හැකි ද ඒ බැඳීම් නැවතත්
මළ සිරුරු පිරිලා ඇත වීදියේ
දවසක් ඒවිදෝ මල් පියුම් විකසිත වෙලා
දුරලා වාද භේද මේ මහා පොළොවේ
මුමුණා ගැයූ සතුටු ගී ඇසි ලොවේ
මුතු සේ සිනා ගැළපිලා
සාම මිහිර කිඳා බැස හදේ
මිහිතලය ම දෙව් විමනක් වී...

**මල්මි සිල්වා**
**9 ශ්‍රේණිය,**
**ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කළුතර.**

# ජන සන්නිවේදනයේ දැවැන්ත මෙහෙවරක නිමාව !



දිනය සැප්තැම්බර් මස 12 වන සිකුරාදා, උදය වරුව. ස්ථානය කොළඹ 05. හැව්ලොක් ටවුමේ කිතුනු පදවි පියතුමන්ලාගේ විශ්‍රාමික නිවස්නය. ගරු බෙනඩික් ජෝශප් පියතුමා සියල්ල පසෙකලා දෙවි මහෝත්තමයාණන්ගේ ආරාධනය පිළිගනී.

ශ්‍රී ලංකා ජාතික කතෝලික සිනමා පර්ෂදයේ දෙවන ජාතික අධ්‍යක්ෂක පියතුමා ලෙස (1983 - 1992) තම දූත කාර්යය අරුත් ගන්වමින් ඉටු කරන ලද සුවිශේෂිත ක්‍රියාන්විතය ඉතිහාස ගතවනු ඇති. සිනමා ශිල්පීනට උත්තමාචාර පිදෙන මංගල්‍යයේ දී, 'ජයවිලාල් විලේගොඩ' සිනමා විචාරක සම්මානය ප්‍රදානය කිරීම හා 'සිනෙසිත්' ප්‍රබුද්ධ සිනමා සඟරාව උන් වහන්සේ ඇරඹූ විශේෂිත ව්‍යාපෘතින් ය.

මෙරට ජනවාර්ගික ගැටලුව ආරම්භ වූ සමයේ කොළඹ අගරදගුරු පදවි සංස්කෘතික මණ්ඩලයේ සභාපතිතුමන් ලෙස සංවිධානය කරන ලද අද්විතීය ප්‍රදර්ශනය 'මානව සංහතියට සාම පරිසරයක්' තේමාව කරගත් චිත්‍ර දැක්ම ජාතික කලා භවනේ දී මුළු ගැන්වුණේ උන්වහන්සේගේ සංකල්පයක් හා පූර්ණ අධීක්ෂණය යටතේ ය. සමස්ත චිත්‍ර ශිල්පීන්ගේ නොමඳ දායකත්වය ඊට ලැබීම කාලීන වෑයමකට ලද මහඟු ප්‍රතිචාරය යි.

පූජක ජීවිත කාලය තුළ උන් වහන්සේ වෙත භාර වුණු ආගමික, සන්නිවේදන හා සංස්කෘතිකමය පැවරීම් ජනතා ප්‍රසාදයට හේතුවන අයුරින් ඉදිරිපත්වීම වැදගත්. 'භක්ති ප්‍රබෝධනය' සඟරාවේ අඛණ්ඩ ප්‍රගමනයට උන් වහන්සේ ලබා දුන් හොඳ හිත අපි සදා අගය කරමු.

සන්නිවේදනයේ විශ්මයාණෙනි, ඔබවහන්සේගේ ආත්මයට සදා සුවය අත් වේවා !

**සංස්කාරක පියතුමා, කාර්ය මණ්ඩලය සමඟ පාඨක සැම.**

සටහන - රූපස් ප්‍රැන්සිස් (ශ්‍රී ලංකා ජාතික කතෝලික සිනමා පර්ෂදයේ හා අගරදගුරු පදවි සංස්කෘතික මණ්ඩලයේ හිටපු ලේකම්)

# ගරු හර්මන් පෝල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා



1942 වර්ෂයේ ජනවාරි මස 15 වැනිදා, ලූවී ප්‍රනාන්දු සහ මාග්‍රට් ලෝව් නම් දෙමාපියන්ට දාව, වර්ණකුලසූරිය ෆ්‍රැන්සිස් හර්මන් පෝල් ප්‍රනාන්දු නම් ළදරුවා මෙලොව උපත ලැබුවේ සලාපුර පදවියේ මාරවිල ග්‍රාමයේදී ය. මාරවිල ශාන්ත මරියා ප්‍රාථමික විදුහලෙන් සිප්සතර හදාරා, ශාන්ත සේවියර් විදුහලෙන් ද ගුරුහරුකම් ලබා 1959 දී 17 හැවිරිදි හර්මන් පෝල් නව යෞවනයා කොහුවල ශාන්ත ජෝසප් නිර්මල මරිය නිකායික කනිටු දෙව්සත්හලට ඇතුළු වන්නේ නොනිත් ආශාවෙනි.

1962 දී කළුතර Mont Eden ආධුනිකාරාමයේ දෙව්දුන් වෙතින් ලත් කැඳවීම ගැන ගැඹුරින් මෙනෙහි කළ ඉක්බිති, 1963 මැයි 31 වනදා නිමල මරිය නිකාය තුළ පැවිදි ජීවිතයට ඇතුළු වුයේ ය. පසුව මහනුවර අම්පිටිය නි.ම.නි. දෙව්සත්හලට පැමිණ දර්ශනවාදය සහ දේව ධර්මය පිළිබඳ හැදෑරීමෙන් අනතුරුව, 1966 මැයි 31 වන දින සදාකාලික වේදභාර පොරොන්දු ලබා ගත්තේය. එවකට බදුල්ල පදවි එඬේරාණන් වූ, ස්වර්ගස්ථ එඩ්මන්ඩ් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන් අතින්, හර්මන් පෝල් තේවාචාර්යතුමා උතුම් වූ පූජකවර සක්‍රමේන්තුවට උරුමකම් කීවේ 1970 වර්ෂයේ මැයි පළමු වැනිදා යි. අනතුරුව, එතුමා නේක වූ සේවාවන් රැසක නිරත වීම කැපී පෙනෙන්නකි.

- මීසම් සේවාව (රාගම, මරදාන, නිකවැරටිය, අම්පිටිය)
- ප්‍රාදේශාධිපති පියතුමන්ගේ ලේකම් ධූරය
- ළමා ක්‍රියාකාරී වීරයෝ හෙවත් ළ. ක්‍රි. වී. සංවිධානයේ ජාතික අධ්‍යක්ෂක ධූරය මෙන්ම
- භක්ති ප්‍රබෝධනය සඟරාවේ සංස්කාරක ධූරය
- කොහුවල ශාන්ත ජෝශප් කනිටු දෙව්සත්හලේ අදියුරු ධූරය
- අනුරාධපුර “රජබිම” නි.ම.නි. කේන්ද්‍රයේ අධ්‍යක්ෂක ධූරය අතර විශේෂ වේ.

අවස්ථා දෙකක දී මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර විශ්ව විද්‍යාල වල අධ්‍යාපනය හැදෑරීමටද හර්මන් පෝල් පියතුමන් හට අවස්ථාව සැලසුණි. 1992 සිට 96 දක්වා මීගමුව මාරිස්ටෙලා විද්‍යාලය ඇතුළු පාසල් කිහිපයක ආචාර්යවරයෙකු ලෙස ද හර්මන් පෝල් පියතුමා බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගුරුහරුකම් ලබා දුන්නේය. අනතුරුව අනුරාධපුර රජරට විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි අංශයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙසද වසර ගණනාවක් සේවය කළේ ය. සිය පූජක ජීවිතයේ වසර පනහක් ඉකුත් වූ 2020 වසරේ සිට, පුරා වසර පහක කාලයක් එතුමෝ තම දිවියේ සැඳෑ යාමය ගත කළේ කොහුවල මේරියන් ග්‍රෝව් නිවහන තුළ දී ය. 2025 ඔක්තෝබර් මස 6 වැනිදා හර්මන් පෝල් ප්‍රනාන්දු පියතුමා සුබ මරණයක් අත්කර ගත්තේ, සිය ස්වර්ගීය මැවුම්කරුවාණන් හා දිනෙක ඒකාත්මික වීමේ ඒකායන බලාපොරොත්තුවෙන් බැව් නොඅනුමානය. අප පියතුමන්ගේ වසර 83 ක් වූ ජීවිත ගමන වෙනුවෙන් දෙවි පියාණන් වහන්සේට තුති පැසසුම් පුදමු. සමිඳු නිවස්නේ සදාකාලිකව ජීවත් වීමේ වරම් ඉල්ලා යදිමු.

ගරු ශානිල් ජයවර්ධන නි.ම.නි. පියතුමා

# Heal the World

ඇමරිකාවේ ජීවත් වූ මයිකල් ජැක්සන් ලෝක පූජිත ගායකයෙකි. ඔහුට ආදරය කරන කෝටි සංඛ්‍යාත ජනතාවක් අදටත් ලොව පුරා සිටිති.

'සුවපත් කරන්න ලෝකය' (Heal the World) යන ජනප්‍රිය ගීතය ද ඔහු විසින් ම රචනා කර ගායනා කරන ලද්දකි. මේ ගීතය සාමයට පිපාසිත ලොව පුරා සිටින සියලු ජනී ජනයා අපේක්ෂාවන් රොද බැඳගෙන ශ්‍රවණය කළහ.

**<u>ගීතයේ පසුබිම</u>**

උතුරු සහ දකුණු වියට්නාමය අතර ඇතිවන ගැටුම අතරතුර ඇමරිකානු හමුදාව 60 දශකයේ දී එයට ඍජුව සම්බන්ධ වූහ. අදූරදර්ශී දේශපාලනඥයෝ කිලෝමීටර් දහස් ගණනක් ඈතින් ජීවත් වන උතුරු වියට්නාමිකයන්ට විරුද්ධව යුද්ධ කළහ. දහස් ගණනාවක ඇමරිකානු සොල්දාදුවන්ට ජීවිත පරිත්‍යාග කරන්නට තල්ලු කිරීම නිෂ්ඵල ක්‍රියාවක් බව බලධාරීහු වටහා නොගත්තෝ ය. බහුතර ඇමරිකානුවන් මෙලෙස යුද්ධ කරන්නට තම තරුණ සොල්දාදුවන් වියට්නාමයේ යුධ බිමට යැවීම ගැන දැඩි අප්‍රසාදයක් හා කනස්සල්ලක් දැක්වීය. වියට්නාම යුද බිමේ දී ඇමරිකානු සොල්දාදුවන් දහස් ගණනින් ජීවිත පූජා කළහ. සාමය එකම ප්‍රාර්ථනාවක් කරගත් සාමාන්‍ය ඇමරිකන් පුරවැසියෝ මෙම යුද්ධය ප්‍රතික්ෂේප කළහ. තරුණ ඇමරිකානුවන්ට අවශ්‍ය වූයේ මේ ලෝකය වඩාත් යහපත් ස්ථානයක් කරන්නට ය.

**<u>යුද්ධයක් නිසා ඇතිවන ඵලවිපාක</u>**

යුද්ධයක් ලොව කොහෙ කොයි අයුරින් සිදු වුවත් එහි ප්‍රතිවිපාක භයානක ය.


- හැඬුම්, විලාප, අඳෝනාවල් හැම තැනම ඇහෙන්නට පටන් ගනියි.
- දෙමව්පියන්ට දරුවන් අහිමි වේ.
- දරුවන්ට දෙමව්පියන් අහිමි වේ.
- අත් පා, ඇස් අහිමි වූවන් දහස් ගණනින් බිහි වේ.
- මිනිසුන් අන්ත අසරණ වේ. පාලුව, තනිකම දැනෙයි.
- දේපල විනාශ වේ.
- වැන්දඹුවන් වැඩි වේ.
- රටක සංවර්ධනය ඇණ හිටී.
- තත්පර කීපයකින් මිනිසුන් සරණාගතයන් බවට පත් වේ. අනාථයන් බවට පත් වේ. දරු දැරියන් අනාථ වේ.
- සාමය, සොම්නස වෙනුවට සිත්වල දොම්නස වෛරය ක්‍රෝධය පළි ගැනීම උපදී. ශරීරයෙන් මෙන් ම හදින් ද ගිලන් වෙති. තමන් සාමයෙන් ජීවත් වූ ගම, රට, ආදරණීයයන් අහිමි වෙති. සාමය විනාඩි කීපයකින් විනාශ කළත් එය නැවත ගොඩනගන්නට දීර්ඝ කාලයක් ගත වේ.

"Heal the World" හෙවත් ලෝකය සුවපත් කරන්න යන ගීතයේ පණිවුඩය මෙලෙස සටහන් කරමි. ඔබෙත් මගෙත් හදවත් තුළ තැනක් ඇත. එය "ආදරයයි". ඇත්තෙන්ම ජැක්සන් පවසන ආකාරයට මේ කියන 'ආදරය' කරන්නට ඕනෑ තරම් ක්‍රම සහ විධි ඇත. ඒ සඳහා පියවර ගතහොත් හැඬීම් වැලපීම් නතර වනු ඇත. නිරපරාදේ මිනිසුන් ලක්ෂ ගණනින් මරණයට ගොදුරු වීම නවතිනු ඇත. මනුෂ්‍යයන්ගේ ජීවිතවලට අගයක් අරුතක් දෙන විට මිනිසුන් ඔහේ පවතිනවා වෙනුවට 'ජීවත්වීම' ආරම්භ කරයි (We stop existing and start living).

23 වන පිටුවට ...

**එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**

# ශ්‍රී කුරුසියේ මහිමයෙන් දේශය එකලු කළ මග්ගොන ජාතික කල්වාරිය



ක්‍රි.ව. 1847 නිර්මල මරිය නිකායේ ගරු ස්ටීවන් සෙමරියා ධර්මදූතවරයා ලක්දිවට සැපත් වීමෙන් ශ්‍රී ලංකාවේ එම නිකායේ දූත සේවය ආරම්භ විය. එතුමන් සමග තවත් ඔබ්ලේට් ධර්මදූතවරුන් පැමිණියහ. පසුව එතුමා 1856 අගෝස්තු 17 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රථම නිර්මල මරිය නිකායික රදගුරුතුමන් ලෙස අභිෂේක ලැබීය. ක්‍රි.ව. 1856 දී ඔබ්ලේට් ධර්මදූතවරයෙකු වූ ගරු ක්‍රිස්ටෝපර් බොන්ජින් පියතුමා ලක්දිවට පැමිණියේ ය. එතුමා කොළඹ අගරදගුරු පදවියේ ප්‍රථම අගරදගුරු ය. මේ අතරතුර ක්‍රි.ව. 1871 දී ඉතාලි ජාතික පදවි පූජකවරයෙකු වූ ගරු ඇලෝසියස් ලුයිජි පිච්චනෙල්ලි යතිවරයාණන් ලක්දිවට පැමිණීමෙන් අනතුරුව කළුතර මීසම එතුමන්ට බාර විය.

### ඉඩම මිල දී ගැනීම

ගරු ඇලෝසියස් ලූවීජි පිච්චනෙල්ලි පියතුමා කළුතර ප්‍රදේශයේ ඉපැරණි ගම්මානයක් වූ, මග්ගොන ගම්මානයේ ගල්ගොඩලන්ද නැමති භූමිභාගයෙන් ඉඩම් කැබැල්ලක් මිල දී ගන්නා ලදී. එම ඉඩම් කැබැල්ල පිච්චනෙල්ලි පියතුමා විසින් ක්‍රිස්ටෝපර් බොන්ජින් අගරදගුරු හිමිපාණන්ට ක්‍රි.ව. 1884 දී විකිණීය. එම භූමි භාගයේ කටයුතු ක්‍රි.ව. 1891 සිට වර්තමානය දක්වාම පරිපාලනය වන්නේ නිර්මල මරිය නිකායික පියවරුන් යටතේ ය.

### කුරුස කන්ද

ප්‍රදේශයේ ඇදහිලිවන්තයන් කල්වාරිය ලෙස වහරන එම භූමිය අනෙකුත් දහම් අදහන බැතිමතුන් කුරුස කන්ද ලෙස හඳුන්වයි. ක්‍රි.ව. 1900 පමණ ගරු ඉසිදෝර් බෙල් නි.ම.නි. පියතුමා සහ ගරු ගොන්සාලේස් පැවිදි තුමන් එක් වී එම භූමිය කල්වාරියකට සුදුසු ලෙස සකස් කළේ ය. වර්තමානය වන විට වසර 125ක පිය සටහන් තබා අවසන් කර ඇත. එලෙස ගෙවුණු අතීතය දේව මහිමය සඳහා තිළිණ කරමින් පසුගිය දා වසර 125ක ජුබිලි මංගල්‍යය සැමරීය.

### ජුබිලි වසර ප්‍රකාශ කිරීම

2024 වසරේ මාර්තු මස 31 වන දින නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ ප්‍රාදේශාධිපති අති ගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා ජුබිලි වසර ප්‍රකාශයට පත් කළේ ය. එතැන් සිට වසරක කාල පරාසයක් ගරු ජූඩ් සපරමාදු නි.ම.නි. පියතුමාගේ මෙහෙයවීමෙන් සූදානම් වීමේ කටයුතු ඇරඹිණි. මග්ගොන සාන්ත වින්සෙන්ති නිවාසයේ අදියුරු පියතුමා, පූජක පැවිදි සංඝය සහ ජාතික කල්වාරි පුදබිම සංවර්ධන කමිටුව එක මිටට සොයුරු සොයුරියන් සේ කටයුතු කළේ ය. සංවර්ධන කටයුතු සඳහා මුදල් සොයා ගැනීම අසීරු වුවත් ඒ සඳහා නිරන්තරයෙන් දේව මැදිහත්කම ලැබීය. සියල්ල දෙවි පියාණන්ට බාර දී අපව මෙහෙයවන ලෙස එතුමන්ගෙන් ඉල්ලීය. එම වසරේ දී අප විසින් කළ කටයුතු කොටස් දෙකකි.

1. ආත්මික සූදානම
2. සංවර්ධන කටයුතු

19 වන පිටුවට ...

**එස්. හේමාල් පෙරේරා**
**ලේකම්, මග්ගොන ජාතික කල්වාරි පුදබිම සංවර්ධන කමිටුව.**

# ජීවිතයක වටිනාකම තේරුම් ගනිල්ලා... (කෙටි කතාව)

පරිසරය දෙදරවමින් එකවර බිහිසුණු ශබ්දයක් ඇසුණි. ගිලන් රථය මහත් අමාරුවෙන් නවත්වා ගැනීමට රියදුරා සමත්විය. දේශ සීමාවේ නගරයක් වන මෙහි මෙවැනි ශබ්ද අමුත්තක් නොවූයේ දෙපස වූ රටවල් දෙක යුද වැදී සිටි නිසාය. දෙපසටම බරපතල හානි සිදු කරමින් යුද්ධය පැවතුණි.

ගිලන් රථය තුළ පණ අදිමින් සිටි මැහැල්ල කෙඳිරි ගාන්නට වුවාය.

"දරුවනේ ඇයි උඹලා මෙතැන නැවතුනේ..? මට තේරෙනවා... මට තේරෙනවා. උඹලාට වුණත් තේරුණා නේද මාව තව එහාට අරන් යන එකෙන් වැඩක් වෙන්නේ නැති වග. කමක් නැහැ මම මැරෙන්න සූදානම්. මට දුක උඹලාට, මගේ දරුවන්ට මගේ වයස වෙනතුරුත් ජීවත් වෙන්න නොලැබෙන එක ගැනයි" උපස්ථායිකාව මැහැල්ලට කෑ නොගසන ලෙසට අවවාද කළාය.

"මේ ආච්චියේ ! දෙවියන්ගේ නාමෙට කෑ ගහන්න එපා. ඔහේට ඇහුණ ද මේ පාරේ ඉස්සරහ මහ පිපිරීමක්. සතුරු හමුදාව අපි වටකරලා දැනටමත්, තව ටිකකින් අපේ හමුදාව ආවොත් අපිට පුළුවන් වේවි ජීවිත බේරාගෙන යන්න"

සතුරු හමුදාවේ සෙබළු ගිලන් රිය වට කළහ. සතුරන් වුවද ඔවුන් තුළ රැඳි මිනිස්කම ප්‍රදර්ශනය කරමින් ඔවුහු වෙඩි නොතබා ගිලන් රියට සමීප වූහ. මොහොතක් ගතවන්නට පෙර මහා හඬ නංවමින් තවත් යුද රථයක් එහි ළඟා විය. ඒ ප්‍රතිවාදී කණ්ඩායම් දෙකක මුහුණට මුහුණලා හමුවීමක් විය.

උපස්ථායිකාව දෙවියන් යදින්නට වූහ. දෙපසින් වෙඩි උණ්ඩ වැසි වසින්නට පෙර මැහැල්ල තම සිරුරේ මුළු ශක්තිය යොදා කෑ ගැසුවාය.

"දරුවනේ එපා.. එපා වෙඩි තියා ගන්න එපා. මට මැරෙන්න තියෙන්නේ තව බොහොම පොඩි වෙලාවයි. ඔය ආයුධ පැත්තකට දාලා මෙහාට වරෙල්ලා. මට උඹලාට වචනයක් කතා කරන්න තියෙනවා..."

දෙපස උන් තරුණ නායකයින් දෙදෙනාගේ සිත් ඔවුන්ගේ මෑණිවරු සදිසි වූ මේ මැහැල්ලගේ ආයාචනය හමුවේ සසල විය. තම සහචරයිනට අවි අමෝරාගෙන සිටින්නට අණ දුන් ඔවුහු තම අතවූ ගිනි අවි පසෙකලා දෙපසින් ගිලන් රිය වෙත ළං වූහ.

"උඹලා ආවද ? උඹලා ආවද? දෙවියන්ට ස්තුති වේවා ! ඇස් දෙක පිහිදාලා හොඳට ළං වෙලා බලාපල්ලා දරුවනේ උඹලාට මාව පෙනෙනවද කියලා..?"

තරුණ නායකයෙක් කටහඬ අවදි කළේය. "මොනවද ආච්චියෙ ඔහේ හිතනවද අපේ ඇස් පෙනෙන්නේ නැහැ කියලා. ඔහේට නම් පිස්සු ද කොහෙද. මගේ ඇස් දෙක හරියට සතුරන් හොයා ගෙන යන්නේ වෙඩි උණ්ඩයක් වගේ..."

මැහැල්ල නැවතත් කතාව ඇරඹුවාය. "ඒ වුණාට උඹලා අන්ධ වෙලා.."

මෙවර කතාවට එක් වුයේ රියේ අනෙක් පස කවුළුවෙන් එබී හුන් ප්‍රතිවාදී නායකයාය.

"මොන පිස්සුද ආච්චි මට දැන් හොඳට පේනවා. ඔය එහා කවුළුවෙන් බලා ගෙන ඉන්නෙ සතුරු නායකයා, වෙන එකක් තියා මට පේනවා. එයාගෙ ඇස් දෙකේ නලියන වෛරය, ඒ වගේම පෙනෙනවා අපේ අණ ලැබෙන තුරු නොඉවසිල්ලෙන් බලාගෙන අවි අමෝරා ගෙන ඉන්න අපේ සෙබළු."

"උඹලා බල තණ්හාවෙන් අන්ධ වෙලා. ඔය දැන් සටන් කළාට ඉස්සර උඹලා එකම නෑදෑයෝ.

උඹලා දන්නෙ නැහැ දරුවනේ ඉස්සර ඔය ගඟෙන් එහා පැත්තෙ තමයි මගේ ස්වාමි පුරුෂයා හිටියෙත්. මගේ පුතාගෙ දරුවන් ඉන්නෙත් ඒ පැත්තේ. අද උඹලා එකිනෙකා සටන් කරනවා. උඹලා හොඳට ඉගෙන ගත්ත දරු පැටව්. උඹලා එකතුවෙලා මේ රට දියුණු කරන්න බලා පල්ලා."

මැහැල්ල කහින්නට වුණාය, කැස්සක් සමග ඇයගේ මුවින් රුධිරය කැටි පිටවිය. මැහැල්ලගේ අවසානය ළංව ඇති බව සියල්ලන්ටම වැටහිණි.

"උඹලා කවුරුත් මනුස්ස පරපුරේ දරුවෝ. උඹලා උඹලාටම හතුරු වෙන්න එපා. කෝ මට දියල්ලා දරුවනේ උඹලාගේ අත් ඉඹින්න. මේ මගේ අන්තිම ඉල්ලීම."

ප්‍රතිවාදි නායකයන් දෙදෙනා ගිලන් රථයේ කවුළු වලින් තම සුරත් මැහැල්ල වෙත දිගු කළහ. මැහැල්ල මහත් ආයාසයෙන් එහෙත් මහත් වූ ආදරයෙන් එම දැත් සිඹ තම පපුව මත තබා ගත්තාය.

දැන් දැන් අණ ලැබෙනු ඇතැයි අවි අමෝරා ගත් සෙබළු නොඉවසිලිමත්ව බලා සිටියහ.

"එපා යුද්ධ කරන්න දරුවනේ ජීවිතයේ වටිනාකම තේරුම් ගනිල්ලා..."

ඒ වදන පවසමින් මැහැල්ල අවසන් හුස්ම හෙළුවාය.

දෙපස කවුළුවලින් හැඟුම්බර ලෙසින් තරුණයෝ දෙදෙනා එකිනෙකා දෙස බැලූහ. ආපසු හැරුණු ඔවුහු වාහන දෙසට පිය නැඟූහ. වාහන වලට නැගි ඔවුහු නිහඬව දෙපසට ඇදී ගියේය. උපස්ථායිකාව මැහැල්ලගේ මුහුණ රෙදි කඩකින් වැසුවාය. ගිලන් රිය දේශ සීමාව ඔස්සේ ඉදිරියට ඇදෙන්නට විය.

**රෝහිණී කුමාරි මුවන්දෙනිය**

# සවන් දෙන්න

තමන් රැකවල් වෙනු පිණිස
සැකසූ අවි ආයුධම අනුන්ට එරෙහිවී
තමන්ට වාසියක් නොවෙන
තැනකට පමණක් ගෙන...
තමන්ගේ මතයට එරෙහි වන්නෝ සොය සොයා
ඔවුන් සතුරන් සේ සලකා
ඔවුනොවුන් වෙත අමෝරා එල්ල කිරීම..
කෙතෙක්නම් අසාධාරණද
තමන්ට විතරක් සාධාරණයක් සොයන ලෝකයක
රැකවල් වෙන්නට දෙවිඳුන් සරණය සහ
ඒ ගැන විශ්වාසය නොතකා..
අවි ආයුධ කෙරෙහිම විශ්වාසය තැබීමම
දෙවිඳුන්ට එරෙහිවීමක් නොවෙයිද
හැම තැනම හැම විටම...
ප්‍රේමය ගැන වහසි බස් දොඩා
වෛරයම වැපිරුවොත්
ඒ අස්වැන්න කෙතරම් මාරාන්තිකද
යක්ෂයාගේ අවි රැගෙන
අපි අපි විනාශවෙමුද...
නැතිනම් දෙවි සමිඳුන්ගේ සාමයේ
ප්‍රේමය සවිය රැගෙන අපි අපි සුරැකෙනවාද...
සැබෑ අභියෝගයයි එය
ඔබට මට හෙට නෙවෙයි
කල් නැහැ එය තේරුම් ගෙන
දිවි ගෙවනවාද යන්න තෝරා බේරා ගන්නට
මේ අද දැන් දැන්ම..
දෙවිඳුන් විමසන්නේ ඔබෙන්
ඔබේ හදවතින් හෘද සාක්ෂියෙන්...
ඔබ දෙවි සමිඳුන් හැම අතරින්
ඔබව විශේෂයෙන්
තෝරාගෙන සිටින නිසාම...

සවන් දෙන්න ඔබ ඔබේ හැඟීමට නොවෙයි
දෙවිඳුන් ඔබට දුන් ඔය බුද්ධියට...

**ඩෙන්සිල් - නුගේගොඩ**

# හෙළිදරව්වක ප්‍රගතිය "පුබුදිත හෙළිදරව්ව"

කොතැනක හෝ වූ අප නො දත් සිදුවීමක හෝඩුවාවක් ලැබීමට ඇසීමට පටන් ගත් තැන සිට එය හෙළිදරව්වකි. ඈත කාලයේ මෙන් ම මෑත කාලයේ ද හෙළිදරව්වක තතු විමසීමට අපට ඇත්තේ මහත් කුතුහලයකි. එදාට වඩා අද ජනමාධ්‍යයෙන් කෙරෙන හෙළිදරව් බොහෝ ය. එහෙත් එදා මෙන් ම අදත් අඛණ්ඩව පැවත එන 'භක්ති ප්‍රබෝධනය' සඟරාවෙන් කෙරෙන 'හෙළිදරව්ව' ප්‍රබල ය; අභීත ය; අද්විතීය ය.

ආගමික දේශපාලනික සංස්කෘතිකමය සමාජීය ආදි කුමන ක්ෂේත්‍රයක වුව ද කාලීන වශයෙන් සිදුවන යම් තත්ත්වයක දී ඇත්ත ඇති සැටියෙන් ම ද බොරුව එහි පටන් ගැන්මේ සිට ම ද භක්ති ප්‍රබෝධනය මඟින් හෙළිදරව් කිරීම ඉතිහාසගත කලෙක පටන් රැකගත් අභියෝග යකි. එහි ගෞරවය හිටපු සංස්කාරක පැවිදි වරුනට හා සඟරාවේ කාර්යය මණ්ඩලයට හිමි විය යුතු ය.

භක්ති ප්‍රබෝධනය වත්මන් සංස්කාරක ධූරය දරන ගරු එමාඩ් දල්පතාදු නිර්මල මරිය නිකායික පූජාප්‍රසාදීන් වහන්සේ සාහිත්‍ය හිතැත්තන් වෙනුවෙන් අලුත් වැඩක් කළේ ය. එනම් උන් වහන්සේ භක්ති ප්‍රබෝධනය සඟරාවට සපයන ලද 'හෙළිදරව්ව' ලිපි පෙළ ප්‍රධාන කොට වෙනත් සඟරාවලට සපයන ලද ලිපි හා ගුවන්විදුලි දේශනා ඇතුළත් කොට 'පුබුදිත හෙළිදරව්ව' නමින් කෘතියක් එළි දැක්වූහ.

ශුද්ධ බයිබලයේ හිතෝපදේශයේ දැක්වෙන පරිදි 'දේව ගරු බිය ප්‍රඥාවේ මුල් පියවර යි' යන්න ගුරු කොට ගනිමින් කෘතියේ ස්ථාන කිහිපයකම එම වගන්තිය ස්ථාපිත කරමින් කෘතිය පරිහරණය කරන්නන්ට පාඨකයාට යම් තරමක ප්‍රඥාසම්පන්න බවක් උද්දීපනය කිරීමට එහි කර්තෘ ගරු එමාඩ් දල්පතාදු පූජාප්‍රසාදීන් වහන්සේ සමත් වී ඇත. උන් වහන්සේ ප්‍රාඥයෙකි. 'ජීවිතය කාගෙ ද? කාට ද?' (2010), 'සෙවණෙ කුරුසියේ' (2013), 'ස්වර්ගය කරා' (2018) යන කෘතිවල එතුමා කර්තෘවරයාණෝ ය.

සිය පැවිදි දිවියේ දසවසකට ආසන්න කලක් එතුමෝ දේශනාවාදී පියතුමෙකි. නිර්මල මරිය නිකායේ කැප වූ දූත සේවයක් වන දේශනාවාදී කැඳවීම උන් වහන්සේ තිළිණයක් ලෙස සතුටින් පිළිගත්තේ පොත පත පරිශීලනයෙන් හා විවිධ අත්දැකීම් හරහා ලද පන්නරයෙනි.

'ගරු එමාඩ් පියතුමාගේ මෙම නිර්මාණ භාවනාවක් ලෙස කියවන ඔබට සැබැවින්ම ජීවිතය අර්ථාන්විත කර ගන්නට, සාරධර්ම, ගුණධර්මවලින් පිරිපුන් පුද්ගලයෙකු වන්නට රුකුලක් බව මගේ විශ්වාසය යි'යි ප්‍රාදේශාධිපති අති ගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා පුබුදිත හෙළිදරව්ව කෘතියට සිය ශුභාශිංසන එක් කරමින් දක්වයි.

'සාහිත්‍යකරුවෙක් සමාජ යථාර්ථය විනිවිද දකිමින් නිර්මාණශීලිව තම කෘතින් බිහි කරයි. එවැනි නිර්මාණ මානව සංහතිය කෙරෙහි විචාරශීලි ප්‍රවේශයක් පෙන්නුම් කරයි. ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමාගේ මේ කෘතිය ද එවන් දැක්මකින් නිර්මාණය වූවක් සේ සැලකිය හැකි ය'යි කොළඹ සාන්ත ජුසේවාස් දේව ධර්ම නිකේතනයේ අධ්‍යක්ෂ ගරු ආචාර්ය දයා වැලිකඩආරච්චි පියතුමා කෘතියට සැපයූ සිය පෙරවදනින් දක්වයි.

ආගම යනු කුමක් ද? පල්ලියේ මංගල්‍යය, ඇදහිල්ලට අභියෝග, දික්කසාදය පිළිබඳ

කතෝලික සභා දැක්ම, කවුරු ද සැබෑ අසල්වැසියා? කම්කරුවෝ, බේබදුකම "උඩ යන" නත්තල, බලයට ධනයට ඇතිවන වියරුව, අසාර්ථකත්වය යනු සාර්ථකත්වයේ පදනම යි, වචනය අපගේ සවිය යි ආදි ඉතා වටිනා ලිපි ගීත රචනා කාව්‍ය රාශියකින් පුබුදිත හෙළිදරව්ව සමන්විත ය. ඉන් වඩාත් ම ආකර්ෂණීය වනුයේ අද අපට ගුවන් විදුලියෙන් අසන්නට නො ලැබෙන ගීත ඒ නිර්මාණශිල්පීන්ගේ බුද්ධිමය දේපලට යටත් ව දැක්වීම යි. මෑත කාලයේ ජනප්‍රිය ගීත ද ඊට ඇතුළත් ය. සෑම ලිපියක් ම කියවීමේ රුචිකත්වය ගෙන දෙන සරල බසින් රචනා කර ඇත. උන් වහන්සේගේ කාව්‍ය රචනා ශෛලිය ද අගය කළ යුතු ය. බාල තරුණ වැඩිහිටි සැමට දෛනික දිවියේ ඇතිවන ගැටලු විසඳා ගැනීමට ද පුබුදිත හෙළිදරව්ව මහෝපකාරී වේ. කෙනකුගේ දිවියේ විශේෂ අවස්ථාවක දී ගෞරවයෙන් සෙනෙහසින් ළෙංගතුව තිළිණ කිරීමට වටිනා ත්‍යාගයකි.

'කිතුනු ආධ්‍යාත්මයේ පූර්ණත්වයෙන් නතර නොවී බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගමික හර පද්ධති අධ්‍යයනය කරමින් ඒවා ගරු එමාඩ් දල්පතාදු පියතුමන්ගෙ සේවයට ආදර්ශමත් කර ගැනීම සතුටට කරුණකි' යි ගරු ශානිල් දිනුක ජයවර්ධන නි.ම.නි. පියතුමා පුබුදිත හෙළිදරව්ව කෘතියට ලිපියක් සපයමින් දක්වයි.

භක්ති ප්‍රබෝධනය වත්මන් සංස්කාරක, කතුවර ගරු එමාඩ් දල්පතාදු පූජාප්‍රසාදීන් වහන්සේට අපි සුබ පතමු. දැනුම දිනුම වෙත ගෙනයමින්, කියවීම ප්‍රඥාව වෙත හරවමින් ලිවීම සාහිත්‍යයේ පෝෂණයට කැප කරමින් පැවිදි දිවිය තමන්ට ආභරණයක් නොව අන්‍යයන්ට ආලෝකයක් කරමින් වෙහෙසෙන මිනිසෙක් වන්නට අපි දිරිය දෙමු.

මංගල ජයවර්ධන
ගිංතොට.

**ශ්‍රී කුරුසියේ මහිමයෙන් දේශය එකලු කළ ...**
**15 වන පිටුවෙන්...**

ධර්ම විවේක පැවැත්වීම පෝය දින කුරුසියේ යාගය ආගමික වැඩසටහන තරුණ තරුණියන් සඳහා සම්මේලන, සහෝදර කිතුනු නිකායන් සමග අන්තර් ආගමික සහජීවනය ගොඩනැගීම යනාදි බොහෝ කටයුතු ආත්මිකකාරයෙන් සිදු කරන ලදී. සංවර්ධන කටයුතු එලෙසම කෙරුණු අතර බොහෝ ප්‍රතිසංස්කරණ කටයුතු ද එලෙසින්ම සිදු විය.

### මංගල්‍යය

වසර 125 ජුබිලි මංගල්‍යය පැවැත්වීමට සූදානම් වූයේ පසුගිය අප්‍රියෙල් මස 26 වන දිනය. එහෙත් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් ස්වර්ගස්ථ වීම හේතුවෙන් එදින උත්සවය කල් දැමීමට සිදු විය. අනතුරුව බදුල්ල රදගුරු අති උතුම් ජූඩ් නිශාන්ත සිල්වා හිමිපාණන් ප්‍රධානත්වයෙන් සහ අනුරපුර රදගුරු අති උතුම් නෝබට් අන්ද්‍රාදි හිමිපාණන් සහභාගිත්වයෙන් බෙදුණු ආගමික මහා සංසරත්නය, මුස්ලිම් ආගමික මවුලවිතුමන්ලා සහෝදර කිතුනු නිකායන්ගේ පියතුමන්ලා ඇතුළුව මහජන නියෝජිතවරුන් ප්‍රදේශයේ උසස් රාජ්‍ය නිලධාරීන් ඇතුළු විශාල ජනතාවක් සමඟින් එම උත්සවය සැමරීය. වර්තමානය වනවිට දෙස් විදෙස් ශ්‍රී ලාංකිකයන් ඇතර මග්ගොන ජාතික කල්වාරි පුදබිම නොමැකෙන නාමයකි.



# මුනිවර ජෙරොම් තුමා

ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ ලතින් පෙදෙස ලෙස හැඳින්වූ රෝම අධිරාජ්‍යයේ බටහිර ප්‍රදේශයේ විසූ කිතුනුවන් අතර ඉතා උත්තුංග තැනැත්තෙක් ලෙස සුදුවර ජෙරොම් තුමා හඳුන්වා දීමට පුළුවන. එතුමා කිතු සසුන ආශ්‍රිතව මූලික වශයෙන් වැදගත් කටයුතු දෙකක් ඉෂ්ට කර තිබේ. එකක් නම් ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පෙරළීම යි. එය "වල්ගේට් බයිබලය" වශයෙන් ප්‍රකට වනවා පමණක් නොව රෝමානු කතෝලික පල්ලියේ පිළිගනු ලබන බයිබලය බවට සියවස් ගණනාවක් ම පත්ව තිබිණ. දෙවෙනි කරුණ වන්නේ තාපසාරාම දියුණු කිරීම යි.

මෙතුමා ජන්ම ලාභය ලැබුවේ ක්‍රිස්තු වර්ෂ 331 උතුරු ඉතාලියේ ස්ට්‍රයිඩන් නුවරදී ය. තම දෙමව්පියන් ධනවත් වූ හෙයින් කුඩා අවධියේ ම රෝමයට යවා තර්ක ශාස්ත්‍රය හා ව්‍යාකරණ අධ්‍යනයට කටයුතු කළ හැකි විය. රෝමයේ දී උසස් අධ්‍යාපනය පිණිස සූදානම් වන කාලයේ දී ජෙරොම් තුමා කිතුනුවෙක් ලෙස බෞතිස්මය ලැබීය. එපමණක් නොව ලතින් සාහිත්‍ය ඉතා හොඳින් හදාරා විශාල පුස්තකාලයක අයිතිකරුවෙක් වීමට අවස්ථාව ලැබීය. ජර්මනියේ ට්‍රයර් නගරයේ වෙසෙන සමයේ තාපසාරාම ගැන ඉමහත් පැහැදීමකට පත් වූ හෙතෙම ඉතාලියේ අකිලා නුවර තාපසාරාමයකට ඇතුළත් විය. එසේ වුවද මෙතුමාගේ කථා විලාසයේ පැවැති කෝප ඇතිවන ලකුණ හේතු කොටගෙන බහුතර පිරිස එතුමාගේ එදිරිකාරයින් බවට පත් විය. එබැවින් ඔහු සිටි තාපසාරාමය පවා භේද වී කැඩී ගියේ ය.

රෝම නගරයේ කාලයක් ජීවත් වීමෙන් අනතුරුව ක්‍රිස්තු වර්ෂ 372 දී මෙතුමා ක්‍රිස්තු භක්තිකයන් ඉතාමත් උසස් ලෙස සලකන ලද පලස්තීනයට පිටත් වූ අතර මඟ දී අන්තියෝකියේ කලක් සිට ග්‍රීක බස ඉතා හොඳින් ඉගෙන ගත්තේ ය. එමෙන්ම යුදෙව්වෙක් වශයෙන් සිට අනතුරුව කිතුනුවෙක් වූ තැනැත්තෙකුගේ උපකාරයෙන් හෙබ්‍රෙව් භාෂාව ඉගෙන ගත් අතර ටික කලකට පසු අන්තියෝකියෙන් පිටත්ව නැවත රෝමයට එද්දී කාලයක් කොන්ස්තන්තිනෝපල් නගරයේ නතර වී සිටී ය. එසේම ක්‍රිස්තු වර්ෂ 382 - 285 කාලයේ රෝමයේ සිටියේ ය. එම කාලය තුළ රෝමයේ බිෂොප්වරයා වශයෙන් සිටි දමායුස් තුමා ගීතාවලිය මෙන්ම ශුභාරංචි පොත් හතර ලතින් භාෂාවට පරිවර්තනය කරන්නැයි මෙතුමාට ඇරයුම් කළේ ය. පසුව මොහු ඊළඟ වසර විසිදෙකේ බයිබලය පරිවර්තනය කිරීමේ කාර්යයට කාලය වෙන් කළේ ය. ඊට පසු පලස්තීනය කරා ගිය මොහු එම ප්‍රදේශයේ ශුද්ධ ස්ථානවල සැරිසැරූ පසු, බෙත්ලෙහෙමේ නගරයේ කාන්තාවන්ටත්, පිරිමින්ටත් තාපසාරාම දෙකක් ඇරඹීය. එතැන් සිට අධ්‍යයන කටයුතු කෙරෙහි සම්පූර්ණ කාලය වෙන් කළේ ය. විවිධ අවස්ථාවල හටගත් රෝග, අර්බුද දබර හේතු කොට ගනිමින් ස්වකීය සාහිත්‍ය කාර්යයන්වලට බාධා ඇති වුවද, වියතෙක් වශයෙන් මෙතුමා ප්‍රකට විය.

හෙබ්‍රෙව් මුල් පිටපත මත පරණ ගිවිසුම මූලික විය යුතු බවත්, ග්‍රීක පිටපත මත නොවන බවත් බෙත්ලෙහෙමේ වාසය කරන වකවානුවේ දී මෙතුමාට අවබෝධ විය. එසේ වුවද සෙප්තුවාජින්ත ලෙස හැඳින්වූ ග්‍රීක පිටපත මතුවටද ප්‍රයෝජනයට ගැණින. බොහෝ පිටපත් භාවිතයකින් හා දීර්ඝ කාලයක් වෙහෙසීමෙන් අනතුරුව ක්‍රි.ව. 406 දී පමණ පරිවර්තන කටයුතු නියමාකාරයෙන් අවසන් කළ හැකි විය. එතැන් සිට ලතින් භාෂාව කතා කළ ප්‍රදේශයේ ප්‍රසිද්ධියට පත් බයිබලය ලෙස සලකනු ලැබුවේ ජෙරොම් විසින් ලිඛිත පරිවර්තනය යි. එය වල්ගේට් පිටපත වශයෙන් ද හඳුන්වනු ලබයි. එමෙන්ම ක්‍රිස්තු වර්ෂ දෙවෙනි සියවස පමණ කාලයේ පටන් ලතින් පරිවර්තන කීපයක් පැවැතියද, ඒවා හුදෙක් නව ගිවිසුමට සීමා විය. ඒවා වාචික බසිනි. ඒවායේ භාෂා විලාසය ද දුර්වල වූ අතර එකල රෝමයේ භාවිත කළ පැරැණි

ගිවිසුම් වූයේ ග්‍රීක පිටපත වන සෙප්ටුවාජින්ත නැමැති පිටපත යි. මොහු තම පරිවර්තනවලට යොදා ගත්තේ අදහසින් අදහස ය. මෙතුමා විසින් ලියා ඇති ලිපිවලින් වර්තමානයේ ඉතිරි වී ඇත්තේ 180ක් පමණය. එදා සමාජය පිළිබඳව අපට තොරතුරු සොයා ගත හැකි ය.

සෙසු ආගමිකයන්ට කිතුනුවන්ගේ සාහිත්‍යමය දක්ෂතා නිරූපණය කිරීමට ලියැවී තිබෙන කෘතියක් ලෙස ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ ජීවිත පිළිබඳව මුල් ක්‍රිස්තියානි සාහිත්‍යමය කෘතිය යි. මෙය මුල් ක්‍රිස්තියානි සාහිත්‍ය ඉතිහාස කෘතිය ලෙස හඳුන්වා දිය හැක. පේදුරු තුමාගේ ජීවිත චරිතවල සිට සුදු සබයේ නායකයන් රැසකගේ ජීවිත චරිත 135ක් විග්‍රහ කර තිබේ.

මෙතුමෝ ඉතා උසස් දේවධර්මාචාරයෙකු වන අතර, අද ද ඔහු කිතු බැතියන්ගේ ගෞරවයට බඳුන් වී සිටිති. මොහු කලබලකාරී අයෙකි. එහෙත් ඔහු පසුව නිවැරදි මගට පිවිසෙයි. මෙතුමාගේ මංගල්‍යය ශුද්ධ වූ සභාව විසින් සමරන්නේ සැප්තැම්බර් මස 30 වැනිදා ය.

**මලින්ත බෝපෙආරච්චි**
**දලුගම, කැලණිය.**

## වස්සානයට ආයුබෝවන් !

දකිනාතුරු වස්සානය ඉකිබිඳු මල් යායකි ගිම්හානේ වූ
පෑයූ හිරු මෙනි සඳු ද අහස් කුස නිවනක් නොදැනේ පෙරුම් පිරූ
විකසිත කමලෙහි රොන් සොයනා බිඟුකැල් පෙරමෙන් මන්දෝ නොම වූ
මලානිකයි මේ උදා වසන්තය ඒ මල් උයනම කඳුළු සැලූ

ඇති දේ නැතිකොට නැති දේ සොයමුත් වෙහෙසෙන කළ මනදොළ සිඳෙනා
නැති දේ ඇති වී ඇති බැව් දකිමිනි මඟ හැරුණු ඉමක් යළි සොයනා
සාම විහඟ කැල යුක්ති සයුර මත සීතල ගිනිඅවි පණ පොවනා
ගිජුලිහිණි සිතින් යළි පරවි වෙස් ගත ද මෙත් ගුණ මියැදී එළ නොදෙනා

පෙරුමන් පුරාණ මතු රැඳි දවසක සාමදාන සුව විඳින ලෙසේ
කෙසේ ලබන්දෝ අද නැති නිදහස සිතුවිලි ගිනි ගෙන දැවෙන කළේ
ආයු පියාපත් තටුසලා ගිය ද වික්ෂෝපේ නොව පහව යතේ
දිවි සුරකින සාමය සොයනා කළ ප්‍රාණ අරක්ගත් යුධ පිටියේ

කලබගෑනි එක පිට එක පොදියට කර බැඳ ගත් සමහරු වන්නේ
සාමය පිළිබඳ කට මැද දොඩමින් නව වියැවුල් ඇති කර ගන්නේ
හෙට දින අද බෝ අගෙයි කියා පවසන්නට අනුහස හිමි වනුයේ
අද දින සුහදව කල් යැවුවොත් මිස නොවැ බව නෑ උන් හඳුනන්නේ

සමාජීය යුද අරගල මැද හිඳ සාමය සොයමින් නොතැවීලා
තමන්ගෙ සිත්හි වල් වැදී යට වූ සිත් සුව සාමය ගොඩගන්වා
ඒ මහඟු මිහිර ළඟ රැඳී සොයුරගෙ සිත් පතරේ වූ ද පතුරාලා
සුවඳ බෙදන්; ගිම්හානෙක සිටියද මතු වස්සානෙට මෙත් වඩවා

**ගරු රවිඳු ප්‍රශාන්ත සහෝදරතුමා**
**දහම් සෙවණ, ජේසු නිකායික ආධුනිකාරාමය, කුරුණෑගල.**

# ආධ්‍යාත්මය සහ ආගම්

ආධ්‍යාත්මික වර්ධනය යනු පුද්ගලයන් තුළ මනුස්සකම් ඉස්මතු වී, අමනුස්සකම් යටපත් වීම යි. මනුස්සකම් යනුවෙන් අදහස් වන්නේ සමස්ත මනුෂ්‍ය ස්වභාවය නොව එහි අන්තර්ගත දයාව, කරුණාව, සහකම්පනය ආදි යහගුණයන් වේ. අමනුස්සකම යනුවෙන් අදහස් වෙන්නේ අප තුළ පවතින තිරිසන් ගති වේ. එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ එම ස්වභාවයන් දෙකම හැම කෙනකු තුළ ම වාගේ විවිධ ප්‍රමාණයන්ගෙන් පවතී.

මනුෂ්‍ය ස්වභාවය ගැන වූ විමසිලිමත්බව ආධ්‍යාත්මික වර්ධනයට අනුබලයකි. එමෙන් ම තමාව තේරුම් ගැනීමේ උවමනාවත් අනුබලයකි. ස්වර්ගීය ප්‍රීතිය හෝ නිරාදුක යමෙකුට විවර වන්නේ ඔහුගේ ආධ්‍යාත්මිකත්වය අනුව මිස ඔහුගේ ආගම අනුව නොවේ. අවසාන විනිශ්චය පිළිබඳ උපමාවෙන් කිතුහිමි ඒ බව තහවුරු කර ඇත. සමාජයෙහි ආධ්‍යාත්මික වර්ධනය පැවරී ඇත්තේ ආගම්වලට ය. වෙනත් පොදු විකල්පයන් ඒ සඳහා තවම ගවේෂණය වී නොමැත. වෙනත් විකල්පයක් නොමැති පසුබිමක් තුළ ආගම් ප්‍රතික්ෂේප කරන්නට අපට නොහැකි ය. ජනතාව ආගම් අදහන්නේ ආධ්‍යාත්මික වර්ධනය පතා නොව නමුත් ඔවුන් ආගම් ප්‍රතික්ෂේප කරන්නේ නැත. මන්ද එය ඔවුන්ට සංස්කෘතික අවශ්‍යතාවයක් නිසා ය.

දැහැමියන් බහුල වූ සාමකාමී රටවලට ආගම් අවශ්‍ය නැති බව සැබෑවකි. අපරාධ අවම වෙමින් ඒවායෙහි හිරගෙවල් හිස් වෙමින් පවතින බව සැබෑවකි. දැහැමියන්ට ආගමක් අවශ්‍ය නැති බව සැබෑවකි. වෛද්‍යවරු අවශ්‍ය වන්නේ රෝගීන්ට ය. චින්තනයෙහි පටු වූ, ආවේගියකයින් බහුල වූ, අදැහැමි සමාජයන්හි බහුතරය යම් පමණකට හෝ හික්ම වෙන්නේ ආගම් නිසා ය.

ක්‍රිස්තියානිය, ඉස්ලාමය, බුද්ධාගම, හින්දු ආගම සහ ජුදාගම ලෝකයේ ප්‍රධාන ආගම් වේ. ඒ හැමෙකකුම වාගේ විවිධ උප ප්‍රභේදයන් ද වේ. එම උප ප්‍රභේදයන් එකිනෙක අතර දැකිය හැක්කේ එදිරිවාද වේ. ආගම් පෙනී සිටින්නේ ආධ්‍යාත්මික වර්ධනය වෙනුවෙනි. දිවැසිවරු ආගම් උපයෝගි කර ගන්නෙත් ඒ වෙනුවෙනි. පරිසිවරු ආගම් උපයෝගි කර ගනුයේ නිදහස් චින්තනය හා මානව හිමිකම් මර්දනය කිරීම සඳහා ය; ව්‍යාප්තවාදය හා ආධිපත්‍යතාවය උදෙසා ය. ආගම පදනම් කරගෙන, ලෝකයෙහි සිදු වී ඇති ම්ලේච්ඡ යුද්ධ අපමණ ය.

වැඩි දෙනා ආගමක් අදහනුයේත්, කණ්ඩායමික වීමේ ආස්වාදය, සමාජ ගෞරවය සහ ගුප්ත පිහිට අපේක්ෂාවෙන් මිස, ආධ්‍යාත්මික පෝෂණය අපේක්ෂාවෙන් නොවේ. දේව කැමැත්ත ඉටු වනු පිණිස මෙන් ම යක්ෂ කැමැත්ත ඉටු වනු පිණිසත් ආගම නැමැති උපකරණය උපයෝගි වේ. දිවැසිවරුන් සහ පරිසිවරුන් අතර ඒ සම්බන්ධයෙන් ඇත්තේ සදාතනික අරගලයකි. බෘනෝ පූජකතුමන්ව මරා දැමීම දේව කැමැත්ත නොවේ. අන්‍යාගමිකයන්ව මරා දැමීම, දේව කැමැත්ත නොවේ. බලකාමී යුද අරමුණු වෙනුවෙන් ආගම් උපයෝගි කර ගැනීම දේව කැමැත්ත නොවේ. අන්තර් ආගමික සංවාද මඟින් ධර්ම ගවේෂණය පෝෂණය වේ. බැතිමතුන් ඊට කැප වන්නේ නම්, ආගමික සංහිඳියාවටත්, ආධ්‍යාත්මික වර්ධනයටත් එය ප්‍රබල අනුබලයක් වේ.

සංවාද යනු විවාද නොවේ. විවාදයකදී ඇතත්, සංවාදයක දී දිනන්නෝ හෝ පරදින්නෝ නොවෙති. සංවාදයක දී සිදු වන්නේ තමන් කැමති අදහසක් දැරීමටත් එය හෙළි කිරීමටත් හැම කෙනකුටම හිමි විය යුතු අයිතියට ගරු කරමින්, අන්‍යෝන්‍ය අවබෝධය පුළුල් වීම ය.

**සපුගස්කන්දේ රංජිත්**

## Heal The World 14 වන පිටුවෙන්...

බයිබලීය වදනක් උපුටා ගෙන මයිකල් ජැක්සන් පවසන්නේ ජාතින් කඩු ගන්නවා වෙනුවට එම කඩුවලින් නගුල් සාදා ගෙන මිනිසුන්ව ජීවත් කරන්න පෙලඹෙන බව ය (යෙසායා 2:4, මීකා 4:3). එවිට මේ ලෝකය දෙවියන් වහන්සේගේ සුරපුරය වන බව මයිකල් ජැක්සන් තවදුරටත් පවසයි. හදවතේ ජනිත විය යුතු මේ කුටිය අව්‍යාජ ආදරයකි. බොරු නොකියන බොරු නොකරන ආදරයකින් සමන්විත විය යුතු ය. එසේ කළහොත් මුළු මානව සංහතියට ම මේ ලෝකය ජීවත් විය හැකි වඩා යහපත් දීප්තිමත් දිනක් උදාවනු ඇත. මයිකල් ජැක්සන් මේ ගීතය හරහා පුන පුනාම, ඔහුගේ ළයාන්විත හදවත් ස්පර්ශ කරන හඬින් ලෝකවාසී ජනතාවට, විශේෂයෙන්ම අහිංසක දුප්පත් අවබෝධයක් නැති මිනිසුන්ව යුද්ධයට තල්ලු කරන දේශපාලන බලධාරීන්ට ආරාධනා කරන්නේ තම හදවත්වල මෙවන් කුටියක් සකස් කරගෙන ලෝකය සුවපත් කරන ලෙසටය. මෙය අමරණීය විශ්වීය පණිවුඩයකි.

## හදමු ලස්සන ලෝකයක්

බුදුන් දෙසූ බණ අස අසාත් අප මෛත්‍රී සිත නෑ අපේ
උදේ ගත් පන්සිල් පද පහ දවල් වෙනකොට නෑ වගේ
මෙත්තා මුදිතා කරුණා උපේක්ෂා කියා ඉගෙනුම ලැබ අපේ
අනේ අනිච්චං බුදුන් සිටි රටෙන් ගෙනා දහමත් කෝ අනේ

සණ්ඩු සරුවල් එපා දහමින්ම අපි එකමුතු වෙමු
අපේ ලේ වල පාට වාගේ මිනිස් ලේ රතු වන් මුතු
අපේ රට වගේ රටක් කොහෙවත් නෑ ඒ නිසයි අපි මිණිමුතු
මුතු කුඩය යට එකට එක් වී මුතු වගේ එකමුතු වෙමු


ටිබෙට් ජාතික හිමි එදා ලීව ළමුනට ලස්සන කවි
සින්දු ජාතික මමත්වය ගෙන දුන්න ඒ සින්දු කවි
කවි කියා සී පද කියා නැළවිලි ගී ගයා කීවා කවි
ළමා ගී ගයා සින්දු කීව, කවියෝ ගී සිංදු කවි

දෙසන්නේ බණ කියන්නේ බොරු සෑම පැත්තෙම හොරු ඇතේ
යුද්දෙ ඉවරයි කියා කීවත් රටට වෙන දේ හොර හිතේ
එපා ගිනිබට, යුද්දෙ ඉවරයි, කඩුව එපා කී හරි දේ හිතේ
එසේ කීවේ පියතුමා ගරු මර්සලින් ඕ.එම්.අයි. ජයකොඩි පියේ

රූපවාහිනි, ෆෝන්, කොම්පියුටරේ තියෙනා මේ කල ජාතියේ නැඟුමට එයත්
පෙරමුණට යමු ශ්‍රී ලාංකිකයෝ දැන්, අපි කොයි ජාතියේ එකක්
ලොකු තැනේ, බොරු කියනවා, අපි අහනවා දැන් වහිනවා එකත් එකක්
කටු නඟා සිටු, ශ්‍රී ලංකාද්වීපය හදමු ලස්සන ලෝකයක්

**එම්. ජී. ඩික්සන් ක්‍රිස්ටෝපර් පර්ඩිනැන්ඩස්,**
**දෙහියාගාත, ජා-ඇල.**

# ජීවන යුද්ධය....




රිම් එකෙන් දුවන්නේ
රිම් එකත් ගෙවිල බං
ඇප නැතුව ඉන්නේ

හම්බ කළ රුපියලට
ටැක්ස් එහෙම විදින්නේ
මොකා ආවත් එහෙම
තමයි බං දුවන්නේ
ඉතිං මොන සාමයද
යුද්ධමයි තියෙන්නේ

නොවැම්බර් දෙසැම්බර්
කොළ දෙකයි තියෙන්නේ
මරණියත ජීවයත්
නූලකින් රැදෙන්නෙ
හිරැත් පායන අහසෙ
අකුණු වැසි වසින්නේ
යුද්ධයද..? සාමයද...? ...
"ට්‍රැක් ද බං" අහන්නේ..

චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

# දේව මෑණියෝ



දේව මෑණියෝ අපෙ ආදර මෑණියෝ
සැම නපුරෙන් අප රකිනා මෑණියෝ
දේව පුතුන් අපට දුන්න මෑණියෝ
අපට ආදරේ අපෙ මෑණියෝ

යුද ගින්නෙන් අප බේරූ මෑණියෝ
රෝ ගින්නෙන් ලොව බේරූ මෑණියෝ
මුළු ලෝකෙම ඔබේ අතෙයි මෑණියෝ
සැමට ආදරේ අපෙ ආදර මෑණියෝ

තේවත්තේ සිට අප රකිනා ලංකා මෑණියෝ
දකුණු ලකේ සිට අප රකිනා රුහුණු මෑණියෝ
වන කැලයේ මැද සිටිනා මඩු මෑණියෝ
ඔබයි අපේ රැජිණිය මරිය මෑණියෝ

දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු
6 වසර, ශා. ජෝශප් විදුහල, මරදාන.

# ඕං එහෙනං



ලොවම නසාලන ලොව වනසාලන මහ ම පාපය යුද්ධය යි
එකෙකුට මරු දී තවකෙක් රජ වන ලෝකෙට සාපය යුද්ධය යි
මනුකම මනුදම පෙරදැරි කරගෙන කරත් කතා බහ නවතින්නේ නැති යුද්ධය යි
කුසගිනි යුධ ගිනි මැද්දේ මිනිසුන් දුබලයො වන්නේ යුද්ධය යි

රජ බල ධන බල යුද බල පෙන්නා බැරි උන් නසන්නේ යුද්ධය යි
මෙහෙවු විපතක් නැති කරලන්නට නැති කර යුත්තේ යුද්ධය යි
අර සමුළුත් ඇත මේ සමුළුත් ඇත නිමක් නොවන්නේ යුද්ධය යි
ලෝ වැසි හැමෝම හඬ නැඟිය යුතුව ඇත නවතාලන්නට යුද්ධය යි

යුද්ධ කරන්නට එපා කියනමුත් ගිනි අවි සදන්නෙ ඇයි ද බොලේ
ඇසි පිය හෙලනා කාලෙට සමාන යුද අවි හදන්නෙ ඇයි ද බොලේ
මිනිසුන් සුණු විසුණු කරනු මිස ජීවත් කරන්න නොවේ බොලේ
මොහොතක් හිතන්න ලෝකය තනන්න ඇයි දැයි මෙතරම් පමා බොලේ

ලෝකෙට දෙන්න බෙදා යැයි කීවට සාමය කුඩු පට්ටම් වී යන්නේ
සාම කතා බහ සමිති සමාගම් අස්සෙන් ගෙඩි ගෙඩි පුපුරා යන්නේ
යටත් දේශයක් මොහොතින් අළු කර හැකි නවීන අවි නිපදා ගන්නේ
සාමය සොයමින් ග්‍රහයො හොය හොයා සෙනසුරු සක්වල කරගන්නේ

මවුපියො දූ දරුවන් අතරින් පළමුව පවුලේ සාමය විය යුත්තේ
අසල්වාසීන් ඥාතීන් පවුලේ ගමේ ගොඩේ සැම එක් විය යුත්තේ
රට තොට එක් වී එක ධජයක් යට සොයුරන් සේ එක් විය යුත්තේ
රටත් දිනනු ඇත ලොවත් දිනනු ඇත සාමය ලොව රජ විය යුත්තේ

සාම කුමරුගේ උපත සමරනා සිරිබර සිරි නත්තල් සමයේ
ඇති හැකි නැති බැරි සැවොම එකා මෙන් එකට එකතු වෙමු මේ සමයේ
විශ්වය ගවලෙනක් කරන්නට ලොව දන එක් වෙමු මේ සමයේ
සාමය සමගිය සමාදානයත් උදා වන්න යැයි පතනෙමු මේ නත්තල් සමයේ

හේසන් ඔයස් - සූරිය

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



**"ඉතින් එපා තාත්තෙ මට සෙල්ලම් පිස්තෝලේ යුද්ධ ටැංකි, යුද්ධ භටයො, තුවක්කු, පතරොම්...**

**සෙල්ලමකටවත් කෙනෙකුන් මරන්න මම හිතන්නෙ නෑ පුංචි මගේ හිත සාමෙන් පුරවා ගන්නම් ආදරයයි ලොව අනගිම වටහා ගන්නම්..."**

දුවේ, පුතේ මේ තියෙන්න තරු නැන්දා පාසල් යන කාලෙ ලියූ ළමා ගීතයක කොටසක්. ඒ කාලෙ අපේ රටේ දරුණු යුද්ධයක් තිබුණා. ගොඩක් මිනිස්සු මැරුණා. ගෙවල් දොරවල් නැති වුණා. එයාලට දිගු කාලයක් කඳවුරු බිම්වල අවතැන් වෙලා ඉන්න සිද්ධවුණා. ඔයාල වගේ පුංචි දරුවන්ට පාසල් යන්න නොහැකි වුණා. කන්න බොන්න නැතිවුණා. ඒ වගේම බෝම්බ, වෙඩි උණ්ඩ නිසා දරුවන්ටත් ජීවිත අහිමි වුණා. ආබාධිත වුණා.

මේ අවි ආයුධ අරන් කරපු යුද්ධය අවුරුදු තිහක් විතර දිගට ඇදුණා. ඒත් දුවේ පුතේ, හිත්වල ඇති වුණු යුද්ධය ඒ කියන්නෙ වෙනත් ජාතීන්වලට, ආගම්වලට අයිති වුණත් අපේම සහෝදර ජනතාව ගැන තියෙන සැකය, අවිශ්වාසය, බය වගේ සිතිවිලි යුද්ධ තවම තියෙනවා. මගේ ආගම, මගේ ජාතිය, මගේ ගම - රට තමයි උසස්ම කියල හිතල අනෙක් අයව පහත් කරල සලකන තාක් ඒ යුද්ධය නිමා වෙන්නෙ නෑ.

මම මීට කලිනුත් ගාසා තීරයට ඊශ්‍රායලය බෝම්බ දැමීම නිසා මිනිසුන් විඳින පීඩාවන් ගැන ලිව්වා ඔයාලට මතක ඇති. මෑතක මම දකිනවා වීඩියෝවක්. බීබීසී සිංහල සේවයේ තමයි මේ වීඩියෝව සහ විස්තරය තිබුණෙ. ටෙල් අල්හවා නගරයේ ඉන්න ජදුවා කියන පුංචි පුතා සහ එයාගෙ පවුල යුද්ධය නිසා තමන්ගෙ ගේ දොර අහිමි වුණ පවුලක්. මේ නගරයට ඊශ්‍රායල් හමුදාව බෝම්බ දාද්දි එයාලගෙ තාත්තා ගෙදර නැහැ. කෑම හොයන්න ගිහින්. ජදුවා හිටියෙ සෙල්ලම් කර කර. එයා ආපහු එයාලගෙ තාවකාලික නිවසට යද්දි අම්මත් නැහැ. මල්ලි අඬමින් ඉන්නවා.

ජදුවා, තමන්ගෙ පුංචි මල්ලි කලීද්වත් කරේ තියන් නගරයෙන් පිටතට දුවනවා. බෝම්බ කියන්නෙ හරිම භයානක දෙයක්. වැටුණු තැනක මිනිසුන්වත්, ගොඩනැගිලිවත් ඉතුරු වෙන්නෙ නෑ. දුවල, පුතාල රූපවාහිනියෙන් මේ විස්තර දකිනවත් ඇති.

අවුරුදු අටක් වුණු මේ පුංචි පුතා අවුරුදු එකහමාරක් විතර වයස මල්ලිවත් කරේ තියන් කිලෝමීටර් දහයක් විතර දුරක් ඇවිදල තියෙනවා. එයා ආරක්ෂිත තැනකට ගිහින්. අයියගෙයි, මල්ලිගෙයි මේ ඇවිද යාම පටිගත වූ වීඩියෝවක් නිසා මේ දරුවන්ව සොයාගන්න අම්මටයි, තාත්තටයි හැකිවෙනවා. සහෝදරත්වය වෙනුවෙන් කැපවෙන්න ඒ පුංචි පුතාට තිබුණු ධෛර්යය අපි හැමෝටම ආදර්ශයක් නේද? ජදුවා කියන්නෙ පුංචි වීරයෙක්. මේ වගේ පුංචි වීරුවන් බොහොමයක් ගැන අපිට ගාසා දෙසින් අසන්නට ලැබෙනවා.

ඉතින් දුවේ, පුතේ... යුද්ධය කියන්නෙ ඉතාම නරක දෙයක්. විනාශකාරී දෙයක්. අපි සිතිවිල්ලකින්වත් යුද්ධයට සහය දිය යුතු නෑ. අපේම යාළුවන්, සහෝදරයන් එක්ක ගැටුම් ඇති කරගත යුතු නෑ. පුංචි කාලෙ ඉඳලම ආදරයෙන්, සමගියෙන්, සහෝදරත්වයෙන් ජීවත් වෙන්න පුරුදු වෙන්න.



තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 88

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | | | ■ | 4 | 5 |
| | ■ | | ■ | | ■ | ■ | 6 | | |
| 7 | | | ■ | 8 | | | | ■ | |
| | ■ | ■ | 9 | | ■ | ■ | ■ | 10 | |
| ■ | 11 | 12 | ■ | | ■ | 13 | | | ■ |
| 14 | | | 15 | ■ | 16 | | ■ | | ■ |
| | ■ | 17 | | 18 | | ■ | 19 | | |
| 20 | 21 | ■ | 22 | | | 23 | ■ | | ■ |
| 24 | | | | ■ | ■ | | ■ | 25 | |
| ■ | | ■ | ■ | 26 | | | | | ■ |

හරහට

1. "යුද්ධය හා සාමය" ග්‍රන්ථයේ කතුවරයා
4. ජීවිත නැසීමට යොදා ගනී.
6. ප්‍රාර්ථනා කරනා
7. වාසය කරන තැනැත්තෝ
8. ජීවිතයට හෝ වස්තුවකට හෝ වන හානියට කලින් ලබා ගන්නා වගකීම
9. එක ඇසක් නොපෙනෙන
10. "ආදායම"
11. හංවැල්ල ප්‍රදේශයේ ගමකි.
13. "සමාදානය" යන්නට සමාන වචනයකි.
14. පලතුරු වර්ගයකි.
16. ශරීරය
17. සාමයේ කුමරා උපන් මංගල්‍යය
19. කම්මැලි
20. ආබ්‍රහම් තුමාගේ භාර්යාවගේ නම.
22. ඇති සැටිය, සැබෑ ආකාරය
24. පට්ටාවලින් වියූ වස්ත්‍රය
25. ලෝහමය මූලද්‍රව්‍යයක්
26. පවුල යන්නට සමාන වචනයකි.

පහළට

1. කැටයම් හා චිත්‍ර අතර බහුලව දැකිය හැකි මෝස්තරයකි.
2. ජපානයේ අගනුවර
3. නැවත මතක් කිරීම.
4. යුද්ධයක දී ආයුධ භාවිතයට ආධාර වන ශරීර අවයවය.
6. යුද්ධයක දී හානි වේ.
10. බ්‍රිතාන්‍යය දූපත් අතර දෙවැනියට විශාල දූපත
11. වර්ෂා කාලය
12. "ගලා යන" සමාන අරුත් දේ.
13. කාන්තා ඇඳුමකි.
14. ජීවිත විනාශ කරන මරණීය පාපයකි.
15. ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා ජීවත් වූ ප්‍රදේශය.
16. පාදයේ දණ හිසෙන් ඉහළ කොටස
18. ගිටාරය, වීණාව වැනි සංගීත භාණ්ඩවල ඇත.
21. යම් යම් දේ තැබීමට යොදා ගන්නා තට්ටු සහිත උපකරණය.
22. ඉතා ප්‍රයෝජනවත් තෙලක් සහිත කුඩා ඇට හට ගන්නා ධාන්‍ය වර්ගයකි.
23. යකඩ දම්වැල්

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
සාන්ත වින්සෙන්ති නිවාසය,
මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2025 දෙසැම්බර් 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 88**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 86 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ව | න් | 2 ද | නා | 3 ග | ම | න | 4 කි | | 5 ජු |
| න් | | හ | | ම් | | | ම | | බි |
| 6 ද | ල | යි | ලා | මා | | 7 මා | | 8 අ | ලි |
| නා | | යා | | 9 ලු | 10 ස් | ත්‍රා | 11 ව | | ය |
| 12 ක | න | | 13 ඇ | | 14 තේ | ව | තු | 15 ර | |
| රු | | 16 බී | ම | | ප | | 17 ක | ළ | 18 ය |
| 19 වෝ | ල් | ට් | | 20 ප | න් | 21 ද | මි | | ළි |
| | | | 22 සු | | 23 තු | මි | ක | ම | |
| 24 ප | 25 ය | | ම | | මා | | රු | | 26 ක |
| 27 ස් | ව | ර් | ග | ය | | 28 නි | වා | ස | ය |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමග
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 86 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 86 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - යොෂේන් කරුණානායක, සාන්ත පීතර විදුහල, කොළඹ 04.
- **දෙවන ස්ථානය** - ට්‍රීෂා නිකොලි සෝසා, 7 ශ්‍රේණිය, ආවේ මරියා කන්‍යාරාමය, මීගමුව.
- **තෙවන ස්ථානය** - සාවියෝ දිනෙත් සෝසා, 9 ශ්‍රේණිය, මාරිස් ස්ටෙල්ලා විදුහල, තිඹිරිගස්කටුව.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2026 ජනවාරි / පෙබරවාරි - "මත් රසින් මත් වී"**
(2026 ජනවාරි - පෙබරවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)
**2026 මාර්තු / අප්‍රේල් - "ආදරය"**
(2026 මාර්තු - අප්‍රේල් කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 ජනවාරි 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) විශ්වාස, බලාපොරොත්තුව හා ප්‍රේමය පදනම් වී සැදී ඇති පණත නම් කරන්න.
(i) දෙවන පණත (ii) පළමු පණත (iii) හයවන පණත (iv) නමවන පණත

(02) විශ්වාසයේ ජීවිතයක් ගත කළ පුද්ගලයන් සඳහන් වන පිළිතුර තෝරන්න.
(i) මරියතුමී සහ ජුවාම් තුමා (ii) ආබ්‍රහම් හා සාරා
(iii) ආබ්‍රහම් තුමා සහ මරියතුමී (iv) මරිය තුමිය සහ එළිසබෙත් තුමී

(03) පොරොන්දු හා බාර හාර ඉටු කිරීම තුළ සිදු වන්නේ කුමක් ද?
(i) ශුද්ධවන්තයන්ට ස්තුති කිරීමකි. (ii) මරිය තුමියට ගරු බිය පෑමකි.
(iii) චාරිත්‍රයක් ඉටු කිරීමකි. (iv) දෙවියන් වහන්සේට ගරුබිය පෑමකි.

(04) නික්මයාම 20:8-11 අනුව තුන්වන පණත නම් කරන්න.
(i) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වන්න. (ii) සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට හිතට ගන්න.
(iii) සබත් දවස රෝගීන්ගේ දිනයකි. (iv) ඉරුදින ණය මංගල්‍යය දිනයකි.

(05) ශුද්ධ වූ බයිබලය තුළ දරුවන්ට හා දෙමව්පියන්ට අවවාද කරන ලිපිය නම් කරන්න.
(i) කොරෙන්ති ලිපිය (ii) පිලමොන් ලිපිය (iii) එපීස ලිපිය (iv) ගලාති ලිපිය

(06) ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට අප විසින් කළ යුතු පළමු ණය යුක්තිය කුමක් ද?
(i) අප පිරිසිදුව සිටීම. (ii) ඥාතීන් බැලීමට යාම.
(iii) රෝගීන් බැලීමට යාම. (iv) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වීම.

(07) නික්මයාම 20:13 ට අනුව පස්වන පණත නම් කරන්න.
(i) සොරකම් නොකරව. (ii) මිනී නොමරව.
(iii) ජීවිත විනාශ නොකරව. (iv) අනුන්ගේ දේ නොගන්න.

(08) මව්කුස තුළ තිබෙන කළලය විනාශ කිරීම කී වෙනි පණතට විරුද්ධ ක්‍රියාවක් ද?
(i) පස්වන පණතට (ii) දෙවන පණතට (iii) අටවන පණතට (iv) හත්වන පණතට

(09) ඇලෙක්සැන්ඩර් පිහියෙන් ඇන මරණයට පත් කළේ කවුරුන්වද?
(i) ශු. ඇග්නස් තුමිය (ii) ශු. සිසිලියා තුමිය
(iii) ශු. මරිය ගොරෙත්ති තුමිය (iv) ශු. බාර්බරා තුමිය

(10) "නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව" මෙය සඳහන් වන බයිබල් පාඨය තෝරන්න.
(i) නික්මයාම 20:18 (ii) උත්පත්ති 20:16 (iii) උත්පත්ති 20:18 (iv) නික්මයාම 20:16

(11) හෙබ්‍රෙව් භාෂාවෙන් "පාලනය" කිරීම යන්නෙහි යෙදෙන වචනය වන්නේ,

(i) රාදා (ii) ෂාමාරි (iii) අබාද් (iv) හොක්මා

(12) ඇතුළාන්ත සාමයට මූලික වන කරුණු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(i) ප්‍රේමය, යුක්තිය, සාමය හා අවංකකම (ii) සත්‍යය, යුක්තිය, ප්‍රේමය හා නිදහස

(iii) දයාව, නිදහස, යුක්තිය හා ප්‍රේමය (iv) ආදරය, ස්නේහය, යුක්තිය හා නිදහස

(13) අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් තුමන් විසින් කරන ලද යැදුම වන්නේ,

(i) ශුද්ධ වූ සභාව වෙනුවෙන් (ii) ශුද්ධවන්තයන් වෙනුවෙන්

(iii) සාමය වෙනුවෙන් (iv) පැවිද්දන් වෙනුවෙන්

(14) සභා නීති සංග්‍රහය තුළ අන්තර්ගත වන්නේ කුමක්ද?

(i) ශුද්ධවන්තයන් ගැන (ii) ගෝලයන් පිළිබඳ

(iii) ශුද්ධ වූ සභා වත්කම් පිළිබඳ (iv) ශුද්ධ වූ සභා විනය හා සෙසු කාරණා

(15) දේව ජනතාවක් ලෙස දෙවියන් වහන්සේට අප පුදන යාගය කුමක් ද?

(i) ශුද්ධ වූ පැය (ii) ගීතිකා ගායනා කිරීම (iii) පඬුරු පිදීම (iv) දිව්‍ය පූජාව

(16) එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථය කුමක් ද?

(i) සිත නිදහස් කර ගැනීම. (ii) දන්දීම. (iii) දානපතියෙක් බව පෙන්වීම. (iv) කෑම ඉතිරි කිරීම.

(17) ජන්ම පාපයෙන් අප නිදහස් වන්නේ කුමන ප්‍රසාද නිධානය ලබා ගැනීමෙන් ද?

(i) රෝගීන්ගේ ආලේපය (ii) දිව්‍ය සත්ප්‍රසාදය (iii) ප්‍රසාද ස්නාපනය (iv) පූජකවරය

(18) ස්වර්ගාරෝහණය විය හැකි වූ එකම තැනැත්තා කවුද?

(i) ස්නාවක ජුවාම් තුමා (ii) මරිය තුමිය (iii) එලිසබෙත් තුමිය (iv) ජේසුස් වහන්සේ

(19) ක්‍රි.ව. 1858 පෙබරවාරි 11 ප්‍රංශයේ ලූර්දු නුවර දේව මාතාවන් දර්ශනය වූයේ කාටද?

(i) බර්නදෙත් (ii) ජසින්තා (iii) ලුසී (iv) මාග්‍රට්

(20) ජනවන්දනා වර්ෂයට අයත් සති ගණන කීයද?

(i) 50 (ii) 48 (iii) 51 (iv) 52

<u>පිළිතුරු</u>

| | | | |
|---|---|---|---|
| (01) ii | (02) iii | (03) iv | (04) ii |
| (05) iii | (06) iv | (07) ii | (08) i |
| (09) iii | (10) iv | (11) i | (12) ii |
| (13) iii | (14) iv | (15) iv | (16) ii |
| (17) iii | (18) iv | (19) i | (20) iv |

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය I

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## ප්‍රඥා සාහිත්‍යය

පසුගිය ලිපියෙන් අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත සාකච්ඡා කිරීම අවසන් විය. මෙම ලිපි පෙළින් සාකච්ඡාවට භාජනය වන්නේ ඉශ්‍රායෙල්වරුන්ගේ ප්‍රඥාව යි.

<u>හැඳින්වීම</u>

ඉපැරණි ශිෂ්ටාචාර ගත වූ රාජ්‍යයන් දෙකක් ලෙස මෙසපොතේමියාව හා ඊජිප්තුව පෙන්වා දිය හැකි ය. එම රාජ්‍යයන් අයත් වන්නේ පුරාණ මැද පෙරදිග කලාපයට ය. පුරාණ මැද පෙරදිග කලාපයට අයත් ප්‍රබල රාජ්‍යයන් වූයේ යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා නිම්න ආශ්‍රිතව ගොඩනැගුණු මෙසපොතේමියාව හා නයිල් නිම්නය ආශිතව වර්ධනය වූ ඊජිප්තු දේශය යි. ප්‍රඥාව ආරම්භ වන්නේ ප්‍රාථමික වශයෙන් එම දේශයන් තුළ ය. ප්‍රඥාව ලෙස කිව හැක්කේ පුද්ගලයෙකු තම මානසික තත්ත්වයෙන් ඔබ්බට ගොස් ජීවිතය ධර්මිෂ්ඨ ලෙසත්, ප්‍රීතිමත් ලෙසත්, සාර්ථකවත් දිවි ගෙවීම ය. එම යුගයේ ප්‍රඥාව ගොඩ නැගී ඇත්තේ ඒක දේවවාදී සංකල්පය මත ය.

ප්‍රඥාව සඳහා යොදන හෙබ්‍රෙව් පදය "හොක්මා" (Hokmah) ලෙස හැඳින්වේ. එහි අර්ථය නිවැරදි දේ කරමින් මෙලොව සුරක්ෂිත භාවය හා ප්‍රීතිය අත්පත් කර ගැනීම යි. ප්‍රඥාව විශ්වීය සංකල්පයකි. එය එක් ජාතියකට හෝ දේශයකට සීමා නොවේ. ජීවිතය නිවැරදිව සාර්ථකව හා ධර්මිෂ්ඨව ගත කරන්නේ කෙසේ දැයි කරන ලද ඉගැන්වීම ප්‍රඥාව යි. එම ප්‍රායෝගික ක්‍රියා පිළිවෙත ලේඛනාරූඪ කර ග්‍රන්ථ ලෙස ලියා තැබීම සාහිත්‍යය යි. ඒ සඳහා ශුද්ධ ලියැවිල්ලේ පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ 7ක් භාවිතා වේ.

1. ජෝබ්
2. ගීතාවලිය
3. ධර්මදේශකයා
4. උපදේශකයා හෙවත් සිරාක්
5. ප්‍රේම ගී
6. සලමොන්ගේ ප්‍රඥාව
7. හිතෝපදේශය යන පොත් ය.

<u>ප්‍රඥා සාහිත්‍යය ගොඩනැගීම</u>

ඉහත පෙන්වා දුන් පොත් 7 පුරාණ මැද පෙරදිග ප්‍රඥාව හා සබඳතා පවත්වයි. මැද පෙරදිග ප්‍රඥාවේ ප්‍රභේද දෙකකි. එනම්,

1. ඊජිප්තුව (මිසරයේ) ප්‍රඥාව එය සෙබයිට් ප්‍රඥාව ලෙස හැඳින්වේ.
2. මෙසපොතේමියාවේ ප්‍රඥාව එය විනයධරයන්ගේ ප්‍රඥාව ලෙස හැඳින්වේ.

සෙබයිට් ප්‍රඥාව පදනම් වූයේ සියලු බලැති දෙවියන් වහන්සේගේ අභිමතය පෙන්වා දෙන විශ්වයේ සැලැස්ම යි. එය හෙබ්‍රෙව් බසින් "ම අට්" (Ma-a-t) ලෙස හඳුන්වයි. එහි අර්ථය යහපත්, සදාචාරාත්මක පැවැත්මකින් දිවි ගෙවීම යි.

එහෙත් විනයධරයන්ගේ ප්‍රඥාව පදනම් වූයේ පුරාණ වැඩවසම් ක්‍රමය තුළ ය. වැඩවසම් ක්‍රමයේ පාලනය සඳහා ඉහළ පැලැන්තියේ පරපුර පුහුණු කිරීමේ ක්‍රමවේදය වේ. රාජකීය ලියවිලි නඩත්තු කිරීම සඳහා එම ප්‍රඥාව භාවිත විය.

පුරාණ මැද පෙරදිග ප්‍රඥාවේ ප්‍රභේද දෙකක් ඇතුවා මෙන් ම පුරාණ ගිවිසුමේ ද අන්තර්ගත ප්‍රඥාව තුළ ප්‍රභේද 4 කි. එනම්,

**1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව**

ගෝත්‍රය හා පවුල ආරක්ෂා කර ගැනීම

සඳහා පිළිපැදිය යුතු සිරිත් විරිත්, සම්ප්‍රදායන් සහ නීති රීති, දරුවන් නිසි පරිදි පුහුණු කිරීම මෙම ආකාරයෙන් බලාපොරොත්තු වේ.

උදා - හිතෝපදේශ 23:13-28

**2. රාජ සභා ප්‍රඥාව**

එහිදී අවධානය යොමු වූයේ නිවැරදිව හා ඵලදායීව සමාජයේ වගකිවයුතු නිලතල දැරීම සඳහා යෞවනයන් පුහුණු කිරීම යනාදිය යි. එය බොහෝ දුරට සමාජයේ ප්‍රභූ පංතිය සඳහා කෙරෙන ලද්දකි.

උදා - හිතෝපදේශ 31:1-9

**3. අභිධාර්මික ප්‍රඥාව**

මෙය සම්බන්ධ වන්නේ ජීවිත ගැටලු සඳහා පිළිතුරු සෙවීමට ය. ඒ සඳහා තුඩු දුන් හේතු සාධක සෙවීම විසඳුම් ඉදිරිපත් කිරීම, ජීවිතයේ හරය පිළිබඳ ඉගැන්වීම සිදු වේ.

උදා - ජෝබ් පොත, ධර්මදේශකයා පොත

**4. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව හෙවත් ප්‍රායෝගික ප්‍රඥාව**

මින් පෙන්වා දෙන්නේ සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා උපදෙස් මාලාවකි. එනම් යමෙකු එදිනෙදා ජීවිතයේ දී මුහුණ දෙන විවිධ අවස්ථාවල දී සාර්ථකව මුහුණ දෙන්නේ කෙළෙස ද යන්න මින් ඉගැන්වේ.

උදා - සලමොන්ගේ ප්‍රඥාව, සිරාක් පොත

<u>පුරාණ ඉශ්‍රායෙල් ප්‍රඥාවන්තයන්ගේ ලක්ෂණ</u>

පුරාණ ප්‍රඥාවන්තයින් අහංකාර පුද්ගලයන් නොව දෙපා බිම තැබිය හැකි පුද්ගලයන් වූහ. අන් අයගේ සිතුම් පැතුම් තේරුම් ගත් ඔවුන් සැබෑ ගුරුවරුන් මෙන්ම උපදේශකයන් ද වූහ. ඔවුන් උගත් ලේඛකයන් පිරිසකි. මානව හිතවාදීන් ලෙස කටයුතු කළ මොවුන් දේව වචනය අධ්‍යනය කරමින් දේව අනාවරණය පිළිබඳව ජනතාව දැනුවත් කළ පිරිසකි. ඔවුන් පෙන්වා දෙන්නේ යාවේ සමිඳාණන් හඳුනා ගැනීම යනු සියල්ලන්ට ම වැඩියෙන් උන් වහන්සේට ගරු කිරීමත් ආදරය දැක්වීමත් යැයි පෙන්වා දේ.

<u>ප්‍රඥා සාහිත්‍යය තුළ ඇති සාහිත්‍යමය ස්වරූප</u>

මේ තුළ විවිධ සාහිත්‍යමය ස්වරූප දැකිය හැකි ය. ඒවා අතර උපදේශ, ප්‍රස්තා පිරුළු, උපමා, විවාද, කථාන්තර, ගීත, උපමාලංකාර පෙන්වා දිය හැක. මෙම පොත්වල බොහෝ විට උපදෙස් ලිවීම ආරම්භ කර ඇත්තේ "මාගේ පුත්‍රය" යන වහර භාවිත කරමිනි. එය ගුරු ගෝල සබඳතාවක් ලෙස හෝ එසේ නොමැති නම් පිය පුතු සබඳතාවක් පෙන්නුම් කරයි.

<u>ප්‍රඥා සාහිත්‍යයේ අධ්‍යාත්මිකත්වය</u>

මෙහි ප්‍රධානම අරමුණ වූයේ ජීවිතය සාර්ථක ලෙසත් දැහැමි ලෙසත් පවත්වා ගෙන යාමට උපදෙස් දීම යි. එමෙන්ම සමාජ පරිපාලනය නිවැරදිව අවබෝධ කර ගෙන දෙවියන් වහන්සේට ප්‍රියමනාප අරුත්බර දිවියක් ගත කිරීමට ජනතාව මෙහෙය වීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

# ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් රචිත අළුත්ම ග්‍රන්ථය දැන් පිට වී ඇත...

කිතුනු පවුලේ අධ්‍යාත්මය ශක්තිමත් කරවන්නට ඔබ වෙත ගෙන එන

# "පුබුදිත හෙළිදරව්ව"

- ආගම යනු කුමක් ද?
- පල්ලියේ මංගල්‍යය
- ඇදහිල්ලට අභියෝග
- විවාහය හා දික්කසාදය
- අම්මා හා තාත්තා
- සාමයේ උල්පත සමාව දීම යි
- දේව දරුවෝ
- චමත්කාරජනක යෞවනය
- මිහිතලයට පිහිතලය නොතබනු
- විභාගය ඔබට අභාග්‍යයක් ද?
- බේබදුකම උඩ යන නත්තල
- බලාපොරොත්තුවේ වන්දනාකරුවෝ


ඇතුළු ලිපි, දේශනා, ගීත හා ගීතිකා, කවි නිසදැස් අඩංගු මාතෘකා 52 කින් සහ පිටු 272කින් සමන්විතයි.

**ඔබගේ පොත ප්‍රමාද නොවී ලබා ගන්න !**

මිල රු. 350/=

- කතෝලික පොත්හල, බොරැල්ල
- අගරදගුරු නිවසේ පුස්තකාලය, බොරැල්ල
- ක්ලැරේෂියන් පොත්හල, වැලිසර (රාගම පාරේ වැලිසර ඩිපෝව ඉදිරිපිට)
- මහ වීදිය දෙව්මැඳුර, මීගමුව
- ශාන්ත පීතර දෙව්මැඳුරේ පොත්හල, මීගමුව
- ආගමික භාණ්ඩ වෙළඳසැල, දුම්රියපොළ පාර, මීගමුව
- දිස්නා පොත්හල, කොන්වන්ට් පාර, වෙන්නප්පුව
- සුදසුන පොත්හල, හලාවත

යන ස්ථානවලින් ලබා ගත හැකි ය.





තැපැල් මගින් ගෙන්වා ගැනීමට නම්,
0718415549 / 0723779365 අමතන්න

# ප්‍රීතිමත් නත්තලක් සහ 2026 නව වසරට ආසිරි!

**Union Chemists**
**( P t e ) L i m i t e d**
*Total healthcare support*
SINCE 1961
SINCE 1961

වසර 65ක් පුරා යූනියන් කෙමිස්ට්ස් ඖෂධ ශාලා ජාලය කෙරෙහි
ඔබ තැබූ විශ්වාසය සමඟ, ඔබගේ සෞඛ්‍යයෙහි දීර්ඝකාලීන යහපැවැත්මෙහිලා
වන නොසැලෙන කැපවීමට අප උරුමකම් කියන්නෙමු!




## අපගේ ශාඛා ජාලය

- යූනියන් පෙදෙස-කොළඹ 02
- ඩීන්ස් පාර-කොළඹ 10
- කිරුළ පාර-කොළඹ 05
- ඇල්ෆ්‍රඩ් පෙදෙස-කොළඹ 03
- කාසල් වීදිය-කොළඹ 08
- කළුබෝවිල
- වත්තල
- තලවතුගොඩ

www.unionchemistspharmacy.lk


මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින්
කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025